2015 වර්ෂය සඳහා

# කාර්යසාධන වාර්තාව

# සහ

# වාර්ෂික ගිණුම්

## වාණිජ දෙපාර්තමේන්තුව

[295 වන ශීර්ෂය]

*4 වන මහල, රක්ෂණ මන්දිරය,*
*අංක: 21, චොක්ෂෝල් වීදිය,*
*කොළඹ 02*
*දුරකථන : 011- 232 9733 / 243 6114*
*ෆැක්ස් : 011 -243 0233*
*විද්‍යුත් තැපැල : fortrade@doc.gov.lk*
*වෙබ් අඩවිය : www.doc.gov.lk*

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1 | හැඳින්වීම | 03 |
| 2 | 2015 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය | 06 |
| 3 | බහුපාර්ශ්වික වෙළඳ සම්බන්ධතා | 11 |
| 4 | ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආර්ථික සහයෝගීතාව | 16 |
| 5 | කලාපීය ආර්ථික සහයෝගීතාව | 21 |
| 6 | වෙළඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනය | 26 |
| 7 | ප්‍රභවස්ථාන සහතික නිකුත්කිරීම | 37 |
| 8 | කාර්ය මණ්ඩල සංචලන 2015 | 39 |
| 9 | වාර්ෂික ගිණුම 2015 | 41 |

## වගු ලැයිස්තුව


| | පිටුව |
|---|---|
| *ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන, සමස්ත අපනයන, සමස්ත වෙළඳාම සහ වෙළඳ ශේෂය (2010 – 2015)* | *07* |
| *වාණිජ නිලධාරීන් විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශය (2011-2015)* | *28* |
| *නිකුත්කරන ලද ප්‍රභවස්ථාන සහතිකපත් (ගිවිසුම් අනුව) 2011-2015* | *38* |


## ප්‍රස්ථාර සටහන් ලැයිස්තුව


| | පිටුව |
|---|---|
| *වාණිජ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන* | *04* |
| *වාණිජ දෙපාර්තමේන්තුවේ සබඳතා* | *05* |
| *ශ්‍රී ලංකාවේ අපනයන හා ආනයන සංයුතිය - 2015* | *08* |
| *2015 ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ ගමන් මඟ* | *09* |
| *ප්‍රධාන ගැනුම්කරුවන් සඳහා ශ්‍රී ලංකාවේ අපනයනය සහ ඔවුන් ලෝකයෙන් සිදුකරන ආනයන (2015)* | *10* |

# 1. හැඳින්වීම

දෙපාර්තමේන්තුවේ දැක්ම

***"ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා තුළින් ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම"***

දෙපාර්තමේන්තුවේ මෙහෙවර


***"සමස්ත නිෂ්පාදන, ආදායම් සහ සේවා නියුක්තිය දියුණු කිරීම තුළින් ජීවන තත්ත්වය නංවාලීම සහ ඉහළ ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීම මගින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනය සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීමේ අරමුණින් යුතුව, රජයේ වෙළඳ ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මගින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතා ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටම්වලින් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම"***

කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන වාණිජ දෙපාර්තමේන්තුව විසින් ද්විපාර්ශ්වික, කලාපීය සහ බහු පාර්ශ්වික මට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ සම්බන්ධතාවල සමස්ත පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. ඒ අනුව වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන කාර්යභාරයට වෙළඳ ප්‍රතිපත්ති සහ ප්‍රවර්ධනයට අදාළ කාර්යයන් ඇතුළත් වේ. වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබන පුළුල් කාර්ය ක්ෂේත්‍රයන් පහත සාරාංශයෙන් දැක්වේ.

- අදාළ රේඛීය අමාත්‍යාංශ / අධිකාරීන් සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන්ගේ සමීප සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රටෙහි අපේක්ෂිත සමස්ත සංවර්ධනය පිළිබඳ විශේෂ අවධානයක් සහිතව විදේශ වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත උපදෙස් ලබාදීම.
- විදේශ වෙළඳ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය යන ක්ෂේත්‍රයන් පිළිබඳ ශ්‍රී ලංකාවේ වාණිජමය අපේක්ෂාවන් ප්‍රවර්ධනය කිරීම.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් විදේශ වෙළඳාම පිළිබඳ රජයේ දැක්ම සහ රටෙහි සමස්ත ආර්ථික සංවර්ධනය කෙරෙහි දැක්විය හැකි මුඛ්‍ය දායකත්වය මත පදනම්ව එහි කාර්ය වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබීය. මෙලෙස, 2015 වසරේ කාර්ය වැඩසටහන මගින්, අනෙකුත් කාර්යයන් අතර, පවත්නා වෙළඳ සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම, නව වෙළඳපළ සොයා ගැනීම, නව නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, අන්තර්ජාතික වෙළඳපලවල් වලට පිවිසීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) අංශ දිරිගැන්වීම සහ දකුණු ආසියානු කලාපයේ වෙළඳ මූලස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත. වාණිජ දෙපාර්තමේන්තුව විසින් එහි විදේශ වෙළඳ නියෝජනය මගින්, සෘජු විදේශ ආයෝජන සහ ආයෝජන කළඹ ප්‍රවර්ධනය මෙන්ම ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයද ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම සහ සහාය ද ලබාදෙන ලදී.

# වාණිජ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන





<u>කෙටි යෙදුම්</u>

| | |
|---|---|
| D | අධ්‍යක්ෂ |
| DD | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| AD | සහකාර අධ්‍යක්ෂ |
| CRO | වාණිජ පර්යේෂණ නිලධාරී |
| DO | සංවර්ධන නිලධාරී |
| Mgt. Asst. | කළමනාකරණ සහකාර |
| KKS | කා. කා. ස. |

* විධායක ශ්‍රේණියේ (අධ්‍යක්ෂ මට්ටමේ) නිලධාරීන් ලෝක වෙළඳ සංවිධානයේ ස්ථිර නියෝජිත/ තානාපති, වොෂින්ටන්, ලන්ඩන්, බ්‍රසල්ස් සහ කරච්චි යන ස්ථානයන්හි දූත මණ්ඩල සඳහා පත්කළ යුතුය.

## වාණිජ දෙපාර්තමේන්තුවේ සබඳතා



## 2. 2015 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම පිළිබඳ සමාලෝචනය

විදේශ වෙළඳාම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන සැලැසුමෙහි ප්‍රමුඛස්ථානයක් හිමි කර ගන්නා අතර, සංවර්ධන ඉලක්කයන් ලඟා කර ගැනීමේදී දායක වන සුවිශේෂී සාර්ව ආර්ථික මෙවලමක් වේ. ලෝක අර්ථිකය හා සම්බන්ධ වෙමින්, ජාත්‍යන්තර වෙළඳ සංවිධානයේ බහුපාර්ශවීය වෙළඳ රාමුව තුල වඩාත් සර්ථක වූ වෙළඳ පාලන තන්ත්‍රයක් ගොඩ නංවා ගැනීමට ලංකාවේ විදේශීය වෙළඳ ප්‍රතිපත්තිය මනා පිටුවහලක් වී ඇත.

ඉහත ඉලක්කයන් ලඟා කර ගැනීම සඳහා විදේශ වෙළඳ ප්‍රතිපත්තිය තුල ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා විදේශීය වෙළඳපොළ පිවිසුම වඩා ශක්තිමත් කර ගැනීම, දේශීය සංවර්ධන රාමුවෙහි වූ වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්තීන් තවදුරටත් සාධාරණීකරනය කිරීමෙන් වෙළඳ ප්‍රවර්ධන කටයුතු ඒකාබද්ධ කිරීම, සාධාරණ වෙළඳ පරිසරයක් සඳහා පහසුකම් ඇති කිරීම මෙන්ම ආයෝජන දිරිමත් කිරීම යන අරමුණු ඇතුලත් වේ. මෙම අරමුණු බහුපාර්ශවීය, කලාපීය හා ද්විපාර්ශවීය වෙළඳ සාකච්ඡා හා අනුබද්ධ වේ.

ගෝලීය මට්ටමින් නිදහස් වෙළඳාම පිළිබඳ පවතින සම්මුති ඇතත්, කුඩා හා අවදානමින් පෙළෙන රටක් වශයෙන් ශ්‍රී ලංකාව බොහෝ අභියෝගවලට මුහුණ දෙමින් සිටී. ඒ අතර දැඩි තාක්ෂණික සහ සෞඛ්‍ය ප්‍රමිති, රේගු කටයුතු සහ ක්‍රියාමාර්ගයන් මෙන්ම තීරුබදු රහිත අනෙකුත් වෙළඳ උපක්‍රම හේතුවෙන් මතුවන අයහපත් ප්‍රතිඵල ද වේ. 2008 ආර්ථික අවපාතයෙන් පසු තීරුබදු රහිත වෙළඳ උපක්‍රම භාවිතය වැඩි වෙමින් පවතී. ආනයනික රටවල තීරුබදු ලිහිල් කිරීම තුළින් ලංකාවේ අපනයන වෙළඳපොල ලද වාසිදායක තත්වය, මෙම තීරුබදු රහිත වෙළඳ උපක්‍රම හේතුවෙන්, නිසි ලෙස ලඟා කර ගැනීමට නොහැකි වී ඇත.

ලෝක වෙළඳපළ තුළ පසුබැසීමේ නැඹුරුතාවයක් පැවතියද, ජාත්‍යන්තරය තුළ ශ්‍රී ලංකාව සිය අපනයනයන්හි ඉදිරි දැක්මක් සඳහා වෙළඳපල පුළුල් කර ගනිමින් පවතී. ඒ සඳහා හඳුනාගත් රටවල් අතර චීනය, බ්‍රසීලය, රුසියාව, තුර්කිය, ජපානය, දකුණු කොරියාව සහ දකුණු අප්‍රිකාව වේ.

අතිශයින්ම වැදගත් වූත් අභියෝගාත්මක වූත් කාර්යභාරයක් වන ශ්‍රී ලංකාවේ අපනයන වෙළඳපොල පුළුල් කර ගැනීම අඛණ්ඩව සිදුකල යුතු කර්තව්‍යයකි. ඒ සඳහා නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ සහ වරණීය වෙළඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ප්‍රවේශයන් තවදුරටත් පුළුල් කරගැනීමටත් පවතින අවස්ථාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගැනීමටත් අවශ්‍ය පියවරයන් ගනිමින් පවතී.

ඒකාබද්ධ කමිටු සාකච්ඡා සහ ඒ හා සම්බන්ධ අනෙකුත් කටයුතු ආදියෙන් වෙළඳ ප්‍රවර්ධන කටයුතු සඳහා අවශ්‍ය අන්‍යෝන්‍ය සහයෝගිතාවය මෙන්ම වෙළඳ කටයුතු හා සම්බන්ධ ගැටලු නිරාකරණය කර ගැනීමට බොහෝ දුරට හැකියාව ලැබී ඇත.

2015 වසර තුලදී ශ්‍රී ලංකාවේ බාහිර වෙළඳ ප්‍රතිපත්තිය තුල අඛණ්ඩ ඉලක්කය වූයේ අපනයන අංශයෙහි සංවර්ධනයයි. මෙහිදී ඵලදායීතාවය වර්ධනය කිරීමත්, ග්‍රාමීය හා නාගරික අංශ තුල ගෝලීය ආර්ථිකය හා සම්බන්ධතාවයන් ඔප්නංවීමත් තුලින් විදේශ වෙළඳාමෙහි ප්‍රතිලාභ බෙදා හැරීමට රජය මූලිකත්වයක් ලබා දී ඇත. ඒ අනුව රටෙහි ආර්ථික ප්‍රතිපත්ති සැලසුම,

- තාක්ෂණික නව නිපැයුම් වර්ධනය කිරීම
- නව කර්මාන්ත කලාපයන් තුල පුද්ගලික ආයෝජන දිරිමත් කිරීම
- රාජ්‍ය සේවා සැපයුම ඉහළ නැංවීම
- කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය

යන කරුණු මූලික කරගෙන කර්මාන්ත අංශයෙහි ජාත්‍යන්තර තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා යෝග්‍ය ලෙසින් සකසා ඇත.


ද.දේ.නි. තුල අපනයන දායකත්වය වර්ධනය කිරීමේ පරමාර්ථයෙන්, රජයේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදී තාක්ෂණික ක්ෂේත්‍රයේ මෙන්ම ලෝක ආර්ථිකයේ අවශ්‍යතාවයන් හා සමගාමී වන නව ආයෝජන දිරිමත් කිරීම මූලික අරමුණු වී ඇත.

### 2.1 ශ්‍රී ලංකාවේ සමස්ත ආනයනය, සමස්ත අපනයනය, සමස්ත වෙළඳාම සහ වෙළඳ ශේෂය 2010 – 2015 (වටිනාකම: ඇ.ඩො.මි)

| වර්ෂය | අපනයන | වර්ධනය % | ආනයන | වර්ධනය % | සමස්ත වෙළඳාම | වෙළඳ ශේෂය |
|---|---|---|---|---|---|---|
| **2010** | 8,294 | 16.5 | 12,340 | 26.4 | 20,634 | -4,047 |
| **2011** | 10,018 | 20.8 | 19,703 | 59.7 | 29,721 | -9,685 |
| **2012** | 9,181 | -8.4 | 17,889 | -9.2 | 27,069 | -8,708 |
| **2013** | 10,009 | 9.0 | 17,098 | -4.4 | 27,107 | -7,088 |
| **2014** | 11,044 | 10.3 | 19,246 | 12.6 | 30,290 | -8,202 |
| **2015** | 10,212 | -7.5 | 18,989 | -1.3 | 29,201 | -8,777 |

*මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව*


## 2.2 අපනයන හා ආනයන කාර්යසාධනය




2015 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ඉපැයුම් ඇමරිකානු ඩොලර් මිලියන 10,212 වූ අතර 2014 වර්ෂය තුළ එය ඇමරිකානු ඩොලර් මිලියන 11,044 කි.

ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයුම් අතර රෙදිපිළි සහ ඇඟළුම් (Apparel) ඉදිරියෙන්ම සිටින අතර එහි දායකත්වය 44.6% කි. 2015 දී රෙදිපිළි සහ ඇඟළුම් ක්ෂේත්‍රයෙහි සුළු බැස්මක් පැවතියද එහි අපනයනයේ ඇති කොටසෙහි වැඩිවීමක් ඇත. අපනයන ඉපැයුම් අතර දෙවන ස්ථානය තේ අපනයනය (Tea) (13%) ගනු ලබන අතර පිළිවෙළින් ඝන සහ අනෙකුත් ටයර් (Solid & other tyres) (3%) ද, නැව් බෝට්ටු සහ එකී ව්‍යුහ (Ships, boats & floating structures) (1.7%) ද, රබර් අත් මේස් (Rubber gloves) (1.6%) ද වේ.


නැව් සහ බෝට්ටු, ගම්මිරිස්, කරාබුනැටි, පොල් සහ කොහු අපනයනය පසුගිය වර්ෂයට වඩා 100% වැඩි වර්ධනයක් පෙන්නුම් කර ඇත.




ශ්‍රී ලංකාවේ සමස්ත ආනයන වියදම 2015 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් මිලියන 18,989 ලෙස පහත වැටී ඇති අතර එය 2014 දී සමස්ත ආනයන වියදම වූ ඇමරිකානු ඩොලර් මිලියන 19,246 ට වඩා 1.3% පහත වැටීමකි.

2015 දී ශ්‍රී ලංකාවේ ආනයන අයිතමයන් අතර ඛණිජ තෙල් (Fuel) 10.1% ක කොටසක් ද සහිතව ඉහළින් ඇති අතර පසුගිය වසරට සාපේක්ෂව ආනයන කොටසෙහි අඩු වීමක් පෙන්නුම් කරයි (17.1%). එයට හේතු වනුයේ 2015 වර්ෂය තුළදී ඛණිජ තෙල් ආනයනයෙහි විශාල වශයෙන් සිදුවූ අඩු වීමයි. ආනයන අයිතමයන්ගෙන් මෝටර් රථ (Motor vehicles) ආනයනය 6.7% ක කොටසක් හිමි කර ගනිමින් එක් පියවරකින් ඉදිරියට පැමිණ ඇති අතර 2015 වසර තුළ ආනයන අගයෙහි සිදුවූ 77% වැඩි වීම මෙයට හේතු වී ඇත. රෙදිපිළි සහ කපු පිළි (Fabrics & Cotton) (6.6%) ද, යකඩ සහ වානේ (Iron & Steel) (5.2%) ද, ප්ලාස්ටික් සහ ද්‍රව්‍ය (Plastics & articles) (3.9%) ද, සහ පෝට්ලන්ඩ් සිමෙන්ති (Portland cement) (2.6%) ද ලෙස 2015 ආනයන සංයුතිය සැකසී ඇත.


## 2.3 2015 හි ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ ගමන් මඟ




| අපනයන (%) | |
|---|---|
| යුරෝපා සං. (EU) | 29.5 |
| ඇ.එ.ජ. (USA) | 27.4 |
| ඉන්දියාව | 6.3 |
| චීනය | 2.9 |
| එ. අරාබි එමීර් (UAE) | 2.7 |

| ආනයන (%) | |
|---|---|
| ඉන්දියාව | 22.5 |
| චීනය | 19.7 |
| යුරෝපා සං. (EU) | 9.5 |
| ජපානය | 7.3 |
| එ. අරාබි එමීර් (UAE) | 5.7 |

## 2.4 ප්‍රධාන ගැනුම්කරුවන් සඳහා ශ්‍රී ලංකාවේ අපනයනය සහ ඔවුන් ලෝකයෙන් (අනෙකුත් රටවලින්) සිදුකරන ආනයන (2015)




*මූලාශ්‍ර: ගැනුම්කරුවන් සඳහා සිදු වන ශ්‍රී ලංකාවේ අපනයන වෙනස්වීම- ශ්‍රී ලංකා රේගුව*
*පාර්ශවකරුවන් ලෝකයෙන් සිදු කරන ආනයනවල වෙනස්වීම- tradematp.org*

මෙම වගුවෙන් ප්‍රධාන ගැනුම්කරුවන් සඳහා ශ්‍රී ලංකාවේ අපනයන වෙනස් වීමේ ප්‍රතිශතය, ඔවුන් ලෝකයෙන් (අනෙකුත් රටවලින්) සිදුකරන ආනයන වෙනස් වීමේ ප්‍රතිශතය සමඟ සසදා දැක්වේ.

2015 ශ්‍රී ලංකාවේ මූලික ගැනුම්කරුවා (ශ්‍රී ලංකාවේ සමස්ත අපනයනයෙන් 27%) වන ඇමරිකානු එක්සත් ජනපදයේ සමස්ත ආනයනය 1.6% න් අඩු වී තිබුණ ද ඇමරිකානු එක්සත් ජනපදයට ශ්‍රී ලංකාවේ අපනයනය 2.9%ක වර්ධනයක් පෙන්නුම් කරයි. එවැනි තත්ත්වයක් ඉන්දියාව (ශ්‍රී ලංකාවේ සමස්ත අපනයනයෙන් 6%) සහ චීනය (ශ්‍රී ලංකාවේ සමස්ත අපනයනයෙන් 3%) සමග ද දක්නට ලැබේ.

එමෙන්ම ශ්‍රී ලංකාවේ දෙවන ප්‍රධාන අපනයනකරුවා වූ එක්සත් රාජධානිය වෙත ශ්‍රී ලංකාවේ අපනයන 7.8% කින් අඩු වුවත් එක්සත් රාජධානියෙහි සමස්ත ආනයනය 9.9% ක ඉහළ අගයකින් අඩු වී ඇත. ජර්මනිය හා බෙල්ජියමෙහි ද මෙම තත්ත්වය දක්නට ලැබේ. මෙම සංඛ්‍යා සටහන මඟින් අප මෙම රටවල් සමග සිදු කරන වෙළඳපළ ගනුදෙනු කොටස සාර්ථකව මෙහෙයවමින් සහ වැඩි දියුණු කරමින් සිදුකරන බව පෙන්නුම් කෙරේ.

## 3. බහු-පාර්ශ්වික වෙළඳ සම්බන්ධතා

ශ්‍රී ලංකාවේ බහු පාර්ශ්වික වෙළෙඳ සම්බන්ධතා මගින් ලෝක වෙළෙඳ සංවිධානයේ (WTO) ගිවිසුම් කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබයි. ශ්‍රී ලංකාව විසින්, වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD), ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සහ ලෝක වෙළඳ සංවිධාන නීතිය පිළිබඳ උපදේශක මධ්‍යස්ථානය (ACWL) ඇතුළත් වෙනත් බහු පාර්ශ්වීය සංවිධාන කිහිපයක් සමඟ සමීප සම්බන්ධතා පවත්වාගෙන යනු ලැබේ.

### 3.1 ලෝක වෙළඳ සංවිධානයේ (WTO) ශ්‍රී ලංකා නියෝජනය

2015 වසරේ දෙසැම්බර් මාසයේ කෙන්යාවේ දී පැවැත්වූ 10 වන අමාත්‍ය හමුවේදී, නීති මත පදනම් වූ බහුපාර්ශ්වීය වෙළඳ ක්‍රමය නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ආයතනය ලෙස ලෝක වෙළඳ සංවිධානයෙහි කාර්යභාරය පිළිබඳව දැඩි ලෙස අවධානය යොමු විය. ශ්‍රී ලංකාව අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවල කණ්ඩායම් සමඟ එක්ව, විශේෂයෙන්ම කුඩා ආර්ථිකයක් ලෙස වෙළඳාම හා සම්බන්ධ සංවර්ධනයන් සඳහා අවශ්‍ය වන්නා වූ කරුණු නිරාකරණය කර ගැනීම සඳහා ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කළේය.

සංවර්ධනය වෙමින් පවතින රටවල් බහුතරයක් විසින් දෝහා සංවර්ධන න්‍යාය පත්‍රය යටතේ සිදු කරන සාකච්ඡාවන් තව දුරටත් ඉදිරියට කරගෙන යෑමේ වැදගත්කම පිළිබඳව අවධාරණය කරන ලද මුත්, දෝහා සංවර්ධන න්‍යාය පත්‍රයේ ඇති ගැටලු පිළිබඳව සාකච්ඡා දිගින් දිගටම පවත්වා ගෙන යෑම සඳහා කිසිදු සම්මුතියක් ඇති නොවීය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කෘෂි කර්මාන්තය සඳහා දේශීය සහය, කෘෂිකර්මාන්තය සඳහා වෙළඳපොළ ප්‍රවේශය, කෘෂිකාර්මික නොවන භාණ්ඩ සඳහා වෙළඳපොළ ප්‍රවේශය (NAMA) සහ සේවා පිළිබඳ සාකච්ඡා ආදී ප්‍රධාන සාකච්ඡාවන් නයිරෝබි අමාත්‍ය සම්මේලනයේ ප්‍රතිඵල අතර නොවීය.

නයිරෝබි අමාත්‍ය රැස්වීමෙහි ප්‍රධාන ප්‍රතිඵලයන්;

- අපනයන සහනාධාර සම්පූර්ණයෙන් ඉවත් කිරීම සඳහා නීතිමය බැඳුමක් සැකසීම.
- කපු පිළි (Cotton) ක්ෂේත්‍රයේ වෙළඳපොළ ප්‍රවේශය, දේශීය අනුග්‍රහය සහ අපනයන තරඟකාරීත්වය සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම.
- ඌණ සංවර්ධිත රටවල් සඳහා වරණීය ප්‍රභවස්ථාන නීති සහ සේවා සහ සේවා සැපයුම්කරුවන් උදෙසා වරණීය සැලකිල්ලක් දැක්වන ආකාරය පිළිබඳ තීරණ ගැනීම.
- සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා විශේෂ ආරක්ෂණ යාන්ත්‍රණය පහසු කිරීම.
- කුඩා අර්ථිකයන් සඳහා කාර්යය වැඩසටහන් පවත්වාගෙන යාමට තීරණය කිරීම.
- විද්‍යුත් වාණිජ්‍ය කටයුතු සඳහා කාර්යය වැඩසටහන් පවත්වා ගෙන යාම.
- ආහාර සුරක්ෂිතතා අරමුණ පෙරදැරිව රජයේ තොග පවත්වාගෙන යාමේ ගැටලුවට ස්ථිර විසඳුම් ලබාගැනීම සඳහා එකඟතාවයකට පැමිණීමට සාකච්ඡා පැවැත්වීම.

අමාත්‍ය තීරණය සම්මත කළ දින සිට පවතින කෘෂිකාර්මික අපනයන සහනාධාර ඉවත් කිරීමට සංවර්ධිත රටවල් අපේක්ෂා කරන අතර, සංවර්ධනය වෙමින් පවතින රටවල් 2018 වසර අවසානයේ දී අපනයන සහනාධාර ඉවත් කිරීමට අපේක්ෂිතය.

ශ්‍රී ලංකාව කුඩා සහ අවධානමට ලක් විය හැකි ආර්ථිකයක් සහිත රටක් ලෙස ලෝක වෙළඳ සංවිධානය විසින් හඳුනාගෙන ඇත. කුඩා සහ අවධානමට ලක් විය හැකි ආර්ථිකයන්ගේ අවශ්‍යතාවන් සැලකිය යුතු සහ අර්ථවත් ආකාරයකින් සපුරාලීමට අදාල වගකීම් අමාත්‍යමණ්ඩල ප්‍රකාශනයේ 27 වන වගන්තියෙන් දැක්වේ. එමනිසා ශ්‍රී ලංකාවට ලෝක වෙළඳ සංවිධානයෙන් එහි වෙළඳාම සම්බන්ධ සංවර්ධන වැඩසටහන් සඳහා තාක්ෂණික සහ ශක්‍යතා සංවර්ධන සහාය ලබාගැනීමේ අවස්ථාව ඇති අතර ඊට අමතරව අමාත්‍ය රැස්වීමේදී යලි ප්‍රතිඥා දුන් කුඩා ආර්ථිකයන් සඳහා කාර්යය වැඩසටහන තව දුරටත් පවත්වාගෙන යාම හේතුවෙන් ලෝක වෙළඳ සංවිධානයෙහි සංවර්ධනය මුල් කරගත් වැඩසටහන් මඟින් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා තවදුරටත් අවස්ථාව සලසා දෙනු ඇත.

## 3.2 වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය

ලෝක වෙළඳ සංවිධානයෙහි කටයුතුවලින් ප්‍රධාන කටයුත්තක් ලෙස ජාතික වෙළඳ ප්‍රතිපත්ති සමීක්ෂණය දැක්විය හැකිය. එවැනි පරීක්ෂණ යාන්ත්‍රණයන් අතර වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචන යාන්ත්‍රණය ප්‍රධාන අංගයක් වේ. ලෝක වෙළඳ සංවිධානයෙහි සෑම සාමාජිකයෙකුම ලෝක වෙළඳාමේ ඔවුන් සතු කොටස අනුව විවිධ මට්ටමින් මෙම සමාලෝචනය සිදුකළ යුතුය. ඒ අනුව ශ්‍රී ලංකාවේ සමාලෝචනය සෑම වසර 06 කටම වරක් සිදුකළ යුතුය. ශ්‍රී ලංකාවේ 4 වන වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචන 2016 නොවැම්බර් මස වනවිට සිදුකළ යුතුය. සාමාන්‍ය සමාලෝචනයක් දියත්කොට අවසාන කිරීම සඳහා මාස 12ක කාලයක් ගතවෙයි. 2015 වර්ෂයේදී ලෝක වෙළඳ සංවිධානය විසින් ශ්‍රී ලංකාවෙන් සිදු කළ මූලික ඉල්ලීම අනුව 2015 දෙසැම්බර් මස දෙපාර්තමේන්තුව විසින් පළමු කාණ්ඩයේ තොරතුරු ලෝක වෙළඳ සංවිධානය වෙත ඉදිරිපත් කර ඇත.

## 3.3 යුරෝපා සංවිධානයේ වරණීය පොදු ක්‍රමය (EU GSP+) නැවත ශ්‍රී ලංකාවට ලබා ගැනීම

ශ්‍රී ලංකාවේ සුදුසුකම් සහ ලබාගත හැකි ආර්ථික දියුණුව සලකා බලා, නව රජය විසින් EU GSP+ පහසුකම ලබා ගැනීම සඳහා නැවත ඉල්ලුම් කිරීමට තීරණය කර ඇත. ඒ අනුව EU GSP+ පහසුකම ලබා ගැනීම සඳහා නැවත ඉල්ලුම් කිරීමට අදාලව වාණිජ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරන අන්තර් අමාත්‍යාංශ අනු කමිටුවක් 2015 මාර්තු මස පත්කරන ලද අතර, එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සම්මුතීන් 27 ක්‍රියාත්මක කිරීමට අදාල රේඛීය ආයතන / අමාත්‍යාංශ සමඟ සාකච්ඡා මලාවක් පවත්වන ලදී. මෙම රේඛීය ආයතන මඟින් ලැබුණු යෙදවුම් එක්කිරීමෙන් (මානව හිමිකම් සම්මුතීන් කිහිපයකට අදාලව තවදුරටත් ලැබීමට නියමිත යෙදවුම් වලට යටත්ව), යුරෝපා සංවිධානය මඟින් ඉදිරිපත් කළ ගැටලු වලට අදාල විස්තරාත්මක වාර්තාවකින් සමන්විත ඉල්ලුම්පතෙහි කෙටුම්පතක් සකසන ලදී.

ඒ අනුව EU GSP+ නැවත ලබාගැනීම පිළිබඳ අයදුම්පතෙහි කෙටුම්පත (එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර සම්මුතීන් දෙකක් සඳහා තව දුරටත් ලැබීමට නියමිත යෙදවුම් වලට යටත්ව) නීතිපති දෙපාර්තමේන්තුව වෙත 2015 නොවැම්බර් මස ඉදිරිපත් කරන ලදී.

## 3.4 යුරෝපා සංවිධානයේ මත්ස්‍ය තහනම ඉවත්කිරීම

යුරෝපා කොමිසමෙහි සමුද්‍රීය කටයුතු සහ ධීවර අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය (DG-MARE) විසින් 2015 නොවැම්බර් මස තාක්ෂණික ඇගයීම් සඳහා ශ්‍රී ලංකාවේ සංචාරයක් සිදු කරන ලදී. එහි ධනාත්මක ප්‍රතිඵල සලකා 2016 මැද භාගය වන විට සම්පූර්ණ කළයුතු නව වැඩසටහනක් (Road Map) නිර්දේශ කරන ලදී.

## 3.5 වෙළඳාම පහසුකරණය

2013 බාලිහි පැවැත්වූ 9 වන අමාත්‍ය රැස්වීමෙහි අමාත්‍ය තීරණය අනුව යමින්, ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකයන් වෙළඳ කටයුතු පහසු කිරීමේ ගිවිසුම (Agreement on Trade Facilitataion-ATF) අනුගත කරගනිමින් පවතී. 2015 දෙසැම්බර් වන විට රටවල් 68 ගිවිසුම අනුමත කර ඇති අතර එය සාමාජික රටවල් තුනෙන් දෙකක ප්‍රමාණයක් (රටවල් 108) ඔවුන්ගේ අනුමැතිය ලබාදුන් පසු නිල වශයෙන් බලාත්මක වනු ඇත. ශ්‍රී ලංකාව ක්‍රියාකාරී ලෙස වෙළඳ කටයුතු පහසු කිරීමේ සාකච්ඡා සඳහා සහභාගි වූ අතර, වෙළඳාම පහසුකරණ ගිවිසුම 2015 නොවැම්බර් මස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා රේගුව සහ වාණිජ දෙපාර්තමේන්තුව සම අසුන් හොබවන වෙළඳ කටයුතු පහසු කිරීමේ ජාතික කමිටුවක් යෝජනා කරනු ලැබ ඇත. ගිවිසුමට අනුව ඒ, බී සහ සී කාණ්ඩ යටතේ වෙළඳාම පහසු කිරීමේ අවශ්‍යතාවන් හඳුනා ගැනීම සඳහා ලෝක වෙළඳ සංවිධානය විසින් අවශ්‍යතා ඇගයුම් වැඩමුළුවක් ශ්‍රී ලංකාවෙහි පැවැත්විය. ඊට අමතරව ලෝක බැංකු කණ්ඩායම විසින් මෙම ගිවිසුමෙහි සෑම වගන්තියක්ම ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටලු හඳුනා ගැනීම සඳහා උපදේශන කණ්ඩායමක් මඟින් පහසුකම් සපයන ලදී.

වෙළඳ කටයුතු පහසු කිරීම සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමෙන් බලාපොරොත්තු වන්නේ වෙළඳ හුවමාරු පිරිවැය සැලකියයුතු මට්ටමකින් අඩු කිරීමෙන් අපනයන හා ආනයන තරඟකාරීත්වය වර්ධනය පහසු කිරීමයි.

## 3.6 ශ්‍රී ලංකාව තුළ ප්‍රපාතන විරෝධී, ප්‍රතිතෝලන සහ ආරක්ෂණ නීති පැනවීම (Anti-Dumping, Countervailing and Safeguard Legislation)

ශ්‍රී ලංකාව තුළ ප්‍රපාතන විරෝධී, ප්‍රතිතෝලන සහ ආරක්ෂණ නීති පැනවීම ක්‍රියාත්මක කිරීම දිගුකලක සිටම අවශ්‍යයව පැවතියකි. 2005 මැයි මස 12 වැනි දින අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මේ සම්බන්ධ නීති කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යවරුන්ගේ අනුමැතිය ලබා දී ඇත. 2006 ජනවාරි මස මෙම බිල්පත් දෙක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට 2006 අප්‍රේල් 4 වන දින දෙවනවර කියවීම සිදු කරන ලදී. එහිදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් විසින් බිල්පත් දෙකෙහි විධිවිධාන සම්බන්ධයෙන් ප්‍රශ්න යොමු කරන ලද අතර එම කරුණු උපදේශක කමිටු රැස්වීම් යටතේ වැඩි දුරටත් සාකච්ඡා කරන ලදී. එම රැස්වීම්වල සාකච්ඡා කෙරුණු කරුණු අනුව බිල්පත් දෙකෙහි කෙටුම්පතට සුදුසු සංශෝධන සිදුකිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යැවීමට තීරණය කරන ලදී. කෙසේ වුවත් මෙම ප්‍රතිශෝධිත බිල්පත් දෙක ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් 2010 පෙබරවාරි මස පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද බැවින් එම බිල්පත් අහෝසි වූ බවට සැලකේ.

ඉන් පසු 2014 ජූලි මස තවත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර අදාල නීති කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත්කරු වෙත යොමු කරන ලද්දේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශයේ නිරීක්ෂණ සැලකිල්ලට ගෙන මෙය ප්‍රමුඛස්ථානය දිය යුතු කටයුත්තක් සේ සලකා කටයුතු කිරීමටයි. ඒ අනුව, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

## 3.7 වෙළඳ භාණ්ඩ සඳහා පොදු අරමුදල (Common Fund for Commodities-CFC)

වෙළඳ භාණ්ඩ සඳහා පොදු අරමුදල (CFC) යනු 1989 එක්සත් ජාතීන්ගේ රාමුව තුළ පිහිටුවන ලද ස්වතන්ත්‍ර අන්තර් රාජ්‍ය මූල්‍ය ආයතනයකි. එය එක්සත් ජාතීන්ගේ සමාජිකයන් 101 දෙනෙකු හා

අන්තර් රාජ්‍ය ආයතන දහයකින් යුත් පාර්ශවකරුවන් 111 දෙනෙකු සහිත සංවිධානයකි. ශ්‍රී ලංකාව CFC හි ආරම්භයේදී සිටම සමාජිකයෙකු වන අතර තේ, කිරි නිෂ්පාදන, කුරුඳු, කොහු, උණ අංකුර, රබර්, පොල්, මත්ස්‍ය නිෂ්පාදන ආදී භාණ්ඩ අංශ සඳහා ප්‍රතිලාභ ලබා ඇත.

භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සමාජීය-ආර්ථික සංවර්ධනය ඇති කිරීම හා සමස්ත සමාජීය සංවර්ධනයට දායක වීම යන නියෝගයෙන් CFC භාණ්ඩ නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි නියැලෙන්නන්ට සහන ණය සහ ප්‍රදාන ලබාදීම මඟින් උපකාර සිදු කරයි. සමාලෝචනය සිදු කරන කාල සීමාව තුලදී CFC හි විධායක කමිටුව එහි 60 වන සැසිවාරයේදී ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ආයතන දෙකකින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා සඳහා අනුමැතිය ලබාදෙන ලදී. ඒ අනුව අවුරුදු 7ක කාලසීමාවකට සහනදායී ණය අනුපාතිකයකට යටත්ව ආසන්න වශයෙන් ඇ.ඩො.මි. 2 ක අනුග්‍රහයක් ශ්‍රී ලංකාවට ලබාදෙන ලදී.

සමාලෝචනය සිදු කරන කාල සීමාව තුළ වාණිජ දෙපාර්තමේන්තුව විසින් CFC හි 60 වන විධායක මණ්ඩල සැසියට සහභාගි වී ශ්‍රී ලංකාවේ ව්‍යපෘති මගින් ඇති ප්‍රතිලාභ ඉදිරිපත් කරන ලදී. විධායක මණ්ඩල රැස්වීම අතරතුරදී ශ්‍රී ලංකාවේ ප්‍රතිලාභ ආරක්ෂා කරගැනීමටත් විධායක මණ්ඩලයේ නිර්දේශයට ඉදිරිපත්කල ශ්‍රී ලංකාවේ ව්‍යපෘති සඳහා නිර්දේශ ලබා ගැනීමටත් වාණිජ දෙපාර්තමේන්තුවට හැකි විය.

## 3.8 ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)

සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අතර ගෝලීය වෙළඳ වරණ ක්‍රමය පිළිබඳ ගිවිසුම 1989 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය යනු දකුණු - දකුණු රටවල් අතර වෙළෙඳාම හා ආර්ථික සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයෙහි (UNCTAD) අනුග්‍රහය යටතේ සාකච්ඡා සම්මුතිවලට එළැඹුණු වරණීය තීරුබදු යෝජනා ක්‍රමයකි.

මෙම යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව ඇ. ඩො. මිලියන 19.17ක වටිනාකමක් සහිත භාණ්ඩ 2014 දී මෙක්සිකෝව හා පේරු වෙත අපනයනය කර ඇති අතර එය 2015 දී ඇ. ඩො. මිලියන 49.57 දක්වා වර්ධනය වී ඇත.

## 3.9 යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය සහ අනෙකුත් වරණීය ක්‍රමයන්හි වර්ධනය

### 3.9.1 යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය (EU GSP)

යුරෝපා කොමිසම සහ යුරෝපා සංගමයේ පාර්ලිමේන්තුව විසින්, 2014.01.01 දින සිට ක්‍රියාත්මක වූ නව GSP යෝජනා ක්‍රමය අනුමත කරනු ලැබ ඇති අතර ශ්‍රී ලංකාව එහි අර්ථලාභියෙකි.

තවද 2014 සිට යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමයේ කලාපයන් අතර සමුච්චිත (Cross Regional Cumulation) විධිවිධාන යටතේ, ඉන්දුනීසියානු සම්භවීය HS ශීර්ෂ 2401 හි නොනිමි දුම්කොළ සහ ප්‍රතික්ෂේපිත දුම්කොළ ආශ්‍රයෙන් සිගරට් නිෂ්පාදනය කර යුරෝපා සංගමය වෙත අපනයනය කිරීමට ශ්‍රී ලංකාව හිමිකම් ලබා ඇත.

### 3.9.2 ඇමරිකා එක්සත් ජනපද වරණීය පොදු ක්‍රමය (US GSP)

ඇමරිකා එක්සත් ජනපද වරණීය පොදු ක්‍රමය වැඩසටහන 2013 ජූනි මස 31 වන දින අහෝසි වී 2015 ජූනි මස 29 වන දින නැවත ව්‍යවස්ථාපිත කරන ලදදේ 2017 දෙසැම්බර් මස 31 වන දින තෙක් වරණීය පොදු ක්‍රමය සඳහා නැවත අවසර දෙමිනි. මෙම පනත මඟින් US GSP ප්‍රතිලාභය 2013 ජූලි 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි සකසා ඇත.

### 3.9.3 ජපාන වරණීය පොදු ක්‍රමය (Japan GSP)

තාවකාලික තීරුබදු පියවර පනත බලාත්මක කිරීම සඳහා අඥාපනතෙහි සංශෝධනය මුල් කර ගනිමින් සරල කරන ලද වරණීය ප්‍රභවස්ථාන නීති ජපාන වරණීය පොදු ක්‍රමය යටතේ ප්‍රකාශයට පත්කොට ඇත.

මෙම සංශෝධනයත් සමඟ රේගු වර්ගීකරණයෙහි 61 වන පරිච්ඡේදයේ ඇති නිෂ්පාදිත (ගොතන ලද හෝ වියන ලද ඇගලුම්) තනි ක්‍රියාවලි න්‍යාය යටතේ (රෙදි වලින් නිෂ්පාදිත ඇඟලුම්) ප්‍රභවීය භාණ්ඩ ලෙස සුදුසුකම් ලබයි. මෙය 2015 අප්‍රේල් මස 01 දින සිට බලාත්මක විය.

2015 වර්ෂය තුලදී ශ්‍රී ලංකාව ඇ. ඩො. මිලියන 3,110.3 ක වටිනාකමකින් යුතු භාණ්ඩ GSP යෝජනා ක්‍රම යටතේ අපනයනය කර ඇත. මින් 68% ක් යුරෝපානු GSP යෝජනා ක්‍රමය යටතේ ද සෙසු ප්‍රතිශතය ඇමරිකානු, පොදු රාජ්‍ය මණ්ඩලීය නිදහස් රාජ්‍යයන් (CIS), ජපාන, කැනඩා, ඕස්ට්‍රේලියානු GSP යෝජනා ක්‍රම යටතේ ද අපනයනය කර ඇත.

## 4. ද්විපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සහයෝගීතාව

2015 වසරේදී, ශ්‍රී ලංකාව විසින් ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් සමඟ මෙන්ම, ශ්‍රී ලංකාව සමඟ වෙළෙඳ කටයුතු සිදුකරනු ලබන අනෙකුත් රටවල් සමඟද ද්විපාර්ශ්වික වෙළෙඳ හා ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් දැඩි විමසිල්ලකින් හා අවධාරණයකින් යුතුව කටයුතු කරන ලදී. යුරෝපා සංගමය, ඇමෙරිකා එක්සත් ජනපදය, ජපානය, වියට්නාමය, තායිලන්තය, දකුණු කොරියාව, රුසියාව සහ පැරණි සෝවියට් සංගමයේ රටවල්, අප්‍රිකානු සහ මැද පෙරදිග කලාපය සමඟ වෙළෙඳ හා ආර්ථික සබඳතා මේ සම්බන්ධයෙන් ප්‍රධාන වී ඇත. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී, ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව හා පාකිස්ථානය සමඟ අත්සන් තබන ලද ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් (FTA) යටතේ සහ චීනය සමඟ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම යනාදිය යටතේ වාණිජමය ප්‍රතිලාභ වැඩිදියුණු කරගැනීම පිළිබඳව වැදගත්කමක් සහිතව කටයුතු කරන ලදී.

### 4.1 ඉන්දියාව වෙත වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා වූ සාකච්ඡා

#### 4.1.1 ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)

1998 දෙසැම්බර් 28 වන දින අත්සන් තබන ලද, 2000 මාර්තු මස 01 වන දින සිට ක්‍රියාත්මක ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම මගින් දෙරට අතර වෙළඳාම් වන පුළුල් නිෂ්පාදන පරාසයක් සඳහා තීරුබදු වලින් නිදහස්වීමේ සහන සැලසේ. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම 2008 නොවැම්බර් මාසයේ සිට පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වී ඇති අතර එමගින්, තීරුබදු අයිතම 4,000 කට අධික ප්‍රමාණයක් යටතට ගැනෙන නිෂ්පාදන තීරුබදු වලින් නිදහස් පදනම මත ඉන්දියානු වෙළඳපොළ වෙත අපනයනය කිරීමේ හැකියාව ශ්‍රී ලංකාව වෙත ලැබී ඇත.

2015 දී ශ්‍රී ලංකාවෙන් ඉන්දියාව වෙත මුළු අපනයන ඇ. ඩො. මිලියන 643 ක් වන අතර ඉන් ඇ. ඩො. මිලියන 407.2 ක් ISFTA යටතේ සිදුවී ඇත. එම අපනයනයන් ද්විපාර්ශවික ගිවිසුම මගින් 63% ක උපයෝජනයක් පෙන්නුම් කරයි. 2014 වර්ෂයේ වාර්තා වූ අගයන් හා සලකා බැලීමේදී මුළු අපනයනයන්ගේ ඉහළ යෑම ප්‍රතිශතයක් වශයෙන් 2.9% ක් ලෙස වාර්තා වූ අතර ISFTA යටතේ අපනයනයන්ගේ 8.4% ක ඉහළ යෑමක් වාර්තා විය.

සමාලෝචනය සිදු කරන වර්ෂය තුල ඉන්දියාවෙන් සිදු කරන ලද මුළු ආනයනයන් හි අගය ඇ. ඩො. මිලියන 4,273 වන අතර ඉන් ඇ. ඩො. මිලියන 253.4 ක් (6%) ISFTA යටතේ සිදුවී ඇත. 2014 වර්ෂයේ වාර්තා වූ අගයන් හා සලකා බැලීමේදී මුළු ආනයනයන්ගේ 7.4% ක වැඩිවීමක් වාර්තා වන නමුත් ISFTA යටතේ ආනයනයන් 53.1% ක පහළ යෑමක් වාර්තා විය.

දෙරට අතර මුළු වෙළෙඳාම ඇ. ඩො. මිලියන 4,916 ක වටිනාකමක් සහිතව, පසුගිය වර්ෂයට සාපේක්ෂව 6.8% ක ඉහළ යෑමක් වාර්තා විය. ශ්‍රී ලංකාවේ සෘණාත්මක වෙළෙඳ ශේෂය පසුගිය වර්ෂයට සාපේක්ෂව 8.3% කින් ඉහළ ගොස් ඇත. කෙසේ වුවත් දෙරට අතර ද්විපාර්ශවික ගිවිසුම යටතේ වෙළෙඳ ශේෂය සැමවිටම ශ්‍රී ලංකාවට වාසිදායකව ඇති අතර 2015 සඳහා එය ඇ. ඩො. මිලියන 153.9 ක වටිනාකමක් වාර්තා විය. මෙම සංඛ්‍යා දත්ත මගින් පිළිබිඹු වන්නේ ඉන්දියානු අපනයනකරුවන් (6%) අභිබවා ශ්‍රී ලංකා අපනයනකරුවන් (63%) ISFTA ගිවිසුම උපයෝජනය කරන බවත් ශ්‍රී ලංකා අපනයනකරුවන් ඉන්දියානු වෙළෙඳපොළට අවතීරණ වීමේදී ඉහළ තීරු බදු සහනයක් බුක්ති විඳිනු ලබන බවත්ය.

### 4.1.2 ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවතින වාණිජ ලේකම් මට්ටමේ සාකච්ඡා

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර 3 වන වාණිජ ලේකම් මට්ටමේ සාකච්ඡා 2015 මාර්තු මස 04 වන දින කොළඹ දී පැවැත්විය. වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය යන අංශවල ද්විපාර්ශවීය සබඳතා වර්ධනය කිරීමට සහ නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අදාල කරුණු ඉලක්ක කර ගනිමින් තාක්ෂණික මට්ටමෙන් සාකච්ඡා පැවතිණි. ඉන්දියානු පාර්ශවයේ යෝජනාව පරිදි ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමට අදාල ගැටලු ඇතුලත් කරමින් වාර්තාවක් සම්පාදනය කර අදාල රේඛීය අමාත්‍යාංශ සමඟ විභාගකොට විමසීම සඳහා ඉන්දියානු අධිකාරීන් වෙත භාර දීමට ශ්‍රී ලංකාව එකඟ විය.

4 වන වාණිජ ලේකම් මට්ටමේ සාකච්ඡා 2015 දෙසැම්බර් මස 21 වන දින නව දිල්ලියෙහි පැවැත්විය. එහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත්තේ යොජිත ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම වෙතයි. 2015 ජූලි මස ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරන ලද බදු නොවන වෙළඳ ක්‍රියාමාර්ගයන් (Non-tariff Measures) ඇතුළත් වාර්තාවට පිළිතුරක් ලෙසින් ඉන්දියානු පාර්ශවය විසින් විභේදනයකින් තොර පදනමකින් ජාතික නීතීන් යොදාගත හැකි බව පැහැදිලි කළ අතර විශේෂිත අවස්ථා විමසීමට එකඟ විය. අපනයනකරුවන්/නිළධාරීන් සඳහා ප්‍රමිතින්, නීති රෙගුලාසි සහ ප්‍රභවස්ථාන සහතික කිරීම් වැනි ශ්‍රී ලංකාවේ අපනයන ඉන්දීය වෙළඳපළට පිවිසීම පහසු කරන සුවිශේෂී තොරතුරු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය කිරීමේ ඉන්දියානු යෝජනාව ශ්‍රී ලංකා පාර්ශවය විසින් පිළිගන්නා ලදී. කොහු සහ කොහුබත් ආශ්‍රිත කර්මාන්තය (cocopeat), සැහැල්ලු ඉංජිනේරු නිෂ්පාදන සැකසීම, තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණ අංශය, මෝටර් රථ සහ ඖෂධ යන අංශයන්හි ඵලදායිතාව වර්ධනය කරගැනීම සඳහා ශ්‍රී ලංකා පාර්ශවය විසින් ඉන්දියාවේ සහය අපේක්ෂා කරන ලදී.

## 4.2 පකිස්ථානය වෙත වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා වූ සාකච්ඡා

### 4.2.1 පාකිස්ථාන – ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)

පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම 2005 ජුනි මස 12 වන දින සිට බලාත්මක වන පරිදි ක්‍රියාත්මක වීමත් සමඟ ශ්‍රී ලංකාව සහ පාකිස්ථානය අතර වෙළඳාමෙහි සැළකිය යුතු වර්ධනයක් වාර්තා වී ඇත. පාකිස්ථානය, සාර්ක් කලාපය තුළ ඉන්දියාවට පසුව ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වෙළඳ හවුල්කරු වේ. ගම්මිරිස්, එළවළු නිෂ්පාදන, බීඩි කොළ, බුලත් කොළ, පොල්කටු කැබලි, ස්වාභාවික රබර්, පොල් සහ අමු හෝ වියලි කජු යනාදිය පාකිස්ථානය වෙත ශ්‍රී ලංකාව විසින් සිදු කරනු ලබන ප්‍රධාන අපනයනයන්ට ඇතුළත් වේ. පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක වීමෙන් අනතුරුව නව නිෂ්පාදන පෙළක්ද පාකිස්ථාන වෙළඳපළ වෙත අවතීර්ණ වී ඇත. ඇඟළුම්, එම්.ඩී.එෆ්. පුවරු, විස්කෝතු, නැවුම් අන්නාසි, ක්‍රීඩා භාණ්ඩ, සියඹලා, ආහාරයට ගත හැකි තෙල්, පෝසිලේන් පිඟන් භාණ්ඩ සහ මුළුතැන්ගෙයි උපකරණ, පිඟන් ගඩොල්, ගෘහභාණ්ඩ, තීන්ත, වීදුරු පින්තාරු, සම් භාණ්ඩ, සීතකළ මාළු, ඉස්සෝ, පොකිරිස්සෝ, කකුළුවෝ, මල් සහ විසිතුරු පත්‍ර, මැණික් හා ස්වර්ණාභරණ සහ සුරතල් මසුන් යනාදී අයිතමයන් මෙම නව නිෂ්පාදනයන්ට ඇතුළත් වේ.

2004 වර්ෂයේදී ඇ. ඩො. මිලියන 147ක් ව පැවති දෙරට අතර මුළු වෙළෙඳාම 2015 දී ඇ. ඩො. මිලියන 370 දක්වා ඉහල ගොස් ඇත. 2004 වර්ෂයේ (ද්විපාර්ශවික ගිවිසුම ක්රියාත්මක වීමට පෙර) සටහන් වූ ඇ. ඩො. මිලියන 39ක ශ්‍රී ලංකා අපනයන අගය 2015 දී ඇ. ඩො. මිලියන 73 දක්වා ඉහල ගොස් ඇත. කෙසේ වුවත් 2014 වර්ෂයට සාපේක්ෂව මුළු අපනයන 1.7% ක සුළු පසු බැසීමක් පෙන්නුම් කරයි. සමාලෝචනය සිදු කරන වර්ෂය තුලදී ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් පකිස්ථානය සමඟ ඇති

ද්විපාර්ශවික ගිවිසුමේ (PSFTA) උපයෝජනය, ආසන්න වශයෙන් 80% ක් පමණ වන අතර එහි වටිනාකම ඇ. ඩො. මිලියන 58.8 ක් වේ.

සමාලෝචන වර්ෂය තුල පාකිස්ථානයෙන් මුළු ආනයන ඇ. ඩො. මිලියන 297ක් වූ අතර ඉන් ඇ. ඩො. මිලියන 42.76 ක් (14.4%) PSFTA යටතේ සිදු වී ඇත. 2014 ට සාපේක්ෂව මුළු ආනයනයනයන්හි 6.2%ක සුළු ඉහල යෑමක් වාර්තා වුවත් PSFTA යටතේ සිදුකල ආනයනයනයන්හි 46% පහල යෑමක් වාර්තා විය.

දෙරට අතර මුළු වෙළෙඳාම පසුගිය වර්ෂයට සාපේක්ෂව 4.6%ක සුළු ඉහල යෑමක් වාර්තා විය. ශ්‍රී ලංකාවේ සෘණාත්මක වෙළෙඳ ශේෂයද 9.1% කින් ඉහල ගොස් ඇත. කෙසේ වුවත් PSFTA ගිවිසුම යටතේ වෙළඳාමෙහි 2014 වර්ෂයේ දී පකිස්ථානයට වාසිදායකව පැවති වෙළෙඳ ශේෂය 2015 දී ශ්‍රී ලංකාවට වාසිදායක වී ඇත. පකිස්ථානු අපනයනකරුවන් (14.4%) අභිබවා ශ්‍රී ලාංකික අපනයනකරුවන් (80.6%) PSFTA ගිවිසුම උපයෝජනය කරන අතර ශ්‍රී ලාංකික අපනයනකරුවන් පකිස්ථානු වෙළෙඳපොළට අවතීරණ වීමේදී ඉහල තීරු බදු සහනයක් බුක්ති විඳීම මෙමගින් පෙන්නුම් කරයි.

### 4.2.2 පකිස්ථාන වාණිජ අමාත්‍යතුමාගේ ශ්‍රී ලංකා සංචාරය - 2015 නොවැම්බර් මස 10-11

පකිස්ථාන අග්‍රාමාත්‍යතුමාගේ 2016 ජනවාරි මස ශ්‍රී ලංකා සංචාරයට පූර්ව සංචාරයක් වශයෙන් පකිස්ථානයේ වාණිජ අමාත්‍යතුමා විසින් පෞද්ගලික අංශයේ නියෝජිතයින් කිහිපදෙනෙක් සමඟ (ඖෂධ, ආහාර, සිමෙන්ති යනාදී අංශයන්හි) ශ්‍රී ලංකා සංචාරය සිදු කරන ලදී.

වාණිජ දෙපාර්තමේන්තුව විසින් පකිස්ථානයේ ව්‍යාපාර අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමට "පකිස්ථානයේ ව්‍යාපාර අවස්ථා" යනුවෙන් ශ්‍රී ලංකා - පකිස්ථාන ව්‍යාපාර අන්තර් ක්‍රියාකාරීත්ව සමුළුවාරයක් නොවැම්බර් මස 11 වන දින ශ්‍රී ලාංකික ව්‍යාපාර ප්‍රජාව සහ දෙරටේ ආමාත්‍යවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට සංවිධානය කරන ලදී.

ඉහත සඳහන් කරන ලද අන්තර් ක්‍රියාකාරීත්ව සමුළුවාරයට සමගාමීව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දිවයිනට පැමිණි පකිස්ථාන ව්‍යාපාරික නියෝජනයන් සමඟ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික අවස්ථා සම්බන්ධයෙන් අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය ඇමතිතුමාගේ සහභාගීත්වයෙන් අන්තර් ක්‍රියාකාරීත්ව සමුළුවාරයක් පැවැත්විය.

ව්‍යාපාර සමුළුවලට අමතරව තව දුරටත් වාණිජ දෙපාර්තමේන්තුව, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව දෙරට අතර වෙළඳාම සහ ආයෝජනයෙහි පවත්නා ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ද්විපාර්ශවීය හමුවක් සංවිධානය කරන ලදී. මෙම හමුවේ දී පකිස්ථාන වාණිජ අමාත්‍යතුමා විසින් සීනි, සිමෙන්ති, ඖෂධ, ආහාර, තොරතුරු තාක්ෂණය සහ ඉදිකිරීම් යන අංශයන්හි ආයෝජනය කිරීමට පකිස්ථාන ව්‍යාපාරික ප්‍රජාවේ ඇති කැමැත්ත සහ උනන්දුව ප්‍රකාශ කරන ලදී.

## 4.3 නව නිදහස් වෙළඳ ගිවිසුම්වලට එළඹීම

### 4.3.1 චීනය සහ ශ්‍රී ලංකාව අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA)

2013 වර්ෂයේදී අතිගරු ජනාධිපතිතුමාගේ චීන සංචාරය අතරතුරදී, නිදහස් වෙළඳ ගිවිසුමක් (FTA) සඳහා වන යෝජනාව පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, 2013 මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ විදේශ

කටයුතු අමාත්‍යාංශය සහ චීනයේ වාණිජ කටයුතු අමාත්‍යාංශය අතර මේ සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයාගේ මඟපෙන්වීම මත මුදල් අමාත්‍යාංශය මූලික ආයතනය වශයෙන් ශ්‍රී ලංකාව වෙනුවෙන් මේ සම්බන්ධයෙන් සාකච්ඡාවල නිරත විය. ඒ අනුව, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුතු වෙළඳ සාකච්ඡා කමිටුවක් පිහිටුවන ලදී. වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ අධ්‍යක්ෂ ජෙනරාල් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙම කමිටුවේ සාමාජිකයින් වශයෙන් පත්කරන ලද අතර, අනෙකුත් අදාල අමාත්‍යාංශවල නිලධාරීන් මෙන්ම පෞද්ගලික අංශයේ නියෝජිතයන් දෙදෙනෙකු (උපදේශකවරුන් වශයෙන්) මෙම කමිටුවට ඇතුළත් විය. මේ දක්වා මෙම කමිටුවේ සාකච්ඡා වට දෙකක් පවත්වා ඇති අතර 2015 ජනවාරි මාසය අවසානයේදී පැවැත්වීමට සැලසුම් කරන ලද තෙවන වටයේ සාකච්ඡා කල් දමනු ලැබ ඇත.

චීනය සමඟ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුමට භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම, ආයෝජනය, රේගු සහයෝගීතාව, වෙළඳාම සඳහා තාක්ෂණික සම්බාධක, සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක නියමයන් සහ ආරක්ෂණය යන අංශයන් ඇතුලත් වේ. ඒ අනුව, චීනය සමඟ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම, විස්තීර්ණ නිදහස් වෙළඳ ගිවිසුමක් ලෙස සළකනු ලැබිය යුතුය.

චීනය සමඟ පළමු වටයේ සාකච්ඡා චීන ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී කොළඹදී පවත්වන ලද අතර දෙවන වටයේ සාකච්ඡා 2014 නොවැම්බර් මාසයේදී චීනයේ බෙයිජින් හිදී පවත්වන ලදී.

තෙවන වටයේ සාකච්ඡා 2016 ජූනි මස කොළඹ දී පැවැත්වීමට තීරණය වී ඇත.

## 4.4 ඒකාබද්ධ ආර්ථික කමිටු සාකච්ඡා (JEC)

ශ්‍රී ලංකාවේ ද්විපාර්ශවීය වෙළඳ සබඳතා යන විෂය තුළ වාණිජ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවට වැදගත් වන වෙළඳ පාර්ශවකරුවන් සමඟ පිහිටුවාගත් වෙළඳ හා ආර්ථික සහයෝගිතාවය පිළිබඳ ඒකාබද්ධ කමිටු සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරන මූලික ආයතනය ලෙස කටයුතු කරයි. ඒකාබද්ධ කමිටු යටතේ ද්විපාර්ශවීය වෙළඳ සාකච්ඡා පැවැත්වීමත් ඒකාබද්ධ කමිටු තීරණ සම්බන්ධීකරණය කිරීමෙන් ක්‍රියාත්මක කිරීමේ කටයුතුත් සිදු කරනුයේ වාණිජ දෙපාර්තමේන්තුව විසිනි. මෙම ඒකාබද්ධ කමිටු සාකච්ඡා වෙළඳාම සම්බන්ධ තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතාවය දිරිමත් කරමින් මෙම රටවල්වලට ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනයකොට පුළුල් කිරීම පහසු කරයි.

මෙම ඒකාබද්ධ කමිටුවල විෂය පථය වෙළඳාම, බැංකු කටයුතු, නාවික සේවා කිරීම ආදීයෙහි සිට අධ්‍යාපනය, විද්‍යාව හා තාක්ෂණවේදය සහ සේවා නියුක්තියෙහි සහයෝගිතාවය දක්වා වූ පුළුල් පරාසයක පැතිරේ. වෙළඳ ප්‍රවර්ධන කටයුතුවලට දායක වීමට අමතරව ඒකාබද්ධ කමිටු තුළින් සාමාජික රටවල සහ ඔවුන්ගේ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අතර අන්‍යොන්‍ය එකඟත්වය සහ සහයෝගිතාවය වර්ධනය කිරීම අපේක්ෂා කරයි.

පහත සඳහන් ද්විපාර්ශ්වික ඒකාබද්ධ කොමිෂන් සභා / කමිටු කැඳවීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පවත්නා කේන්ද්‍රීය ආයතනය වන්නේ වාණිජ දෙපාර්තමේන්තුවයි.

- ශ්‍රී ලංකාව - බංග්ලාදේශය
- ශ්‍රී ලංකාව - බෙලරුස්

- ශ්‍රී ලංකාව - ඊජිප්තුව
- ශ්‍රී ලංකාව - ඉරානය
- ශ්‍රී ලංකාව - ඉරාකය
- ශ්‍රී ලංකාව - කුවේටය
- ශ්‍රී ලංකාව - පාකිස්ථානය
- ශ්‍රී ලංකාව - කටාර්
- ශ්‍රී ලංකාව - රොමේනියාව
- ශ්‍රී ලංකාව - රුසියාව
- ශ්‍රී ලංකාව - ස්වාසිලන්තය
- ශ්‍රී ලංකාව - තුර්කිය

ඉහත ඒකාබද්ධ කොමිෂන් සභා / කමිටුවලට අමතරව පහත ද්විපාර්ශවීය වෙළඳ සාකච්ඡා සඳහා ද වාණිජ දෙපාර්තමේන්තුව කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කරයි.

- ශ්‍රී ලංකාව හා ජපානය අතර අන්තර් රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා පණ ගැන්වීම සඳහා වන අවබෝධතා ගිවිසුම.
- එක්සත් ජනපද - ශ්‍රී ලංකා වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ ගිවිසුම් රාමුව (TIFA) යටතේ ඒකාබද්ධ කවුන්සිලය.
- ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර වෙළඳාම පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම.
- ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර වෙළඳ සහ ආර්ථික සහයෝගිතාවය පිළිබඳ අනු කමිටුව.
- ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර වෙළඳාම පිළිබඳ අනු කමිටුව.
- ශ්‍රී ලංකාව හා කෙන්යාව අතර ඒකාබද්ධ වෙළඳ කමිටුව.

සමාලෝචන කටයුතුවලට ලක් වන කාල සීමාව තුළ වාණිජ දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධ වෙළඳ හා ආර්ථික කමිටු සඳහා සාකච්ඡා නොපැවැත් වූ අතර ඒවා 2016 තෙක් කල් දමන ලදී. කෙසේ වුවත් ශ්‍රී ලංකා - චීන ඒකාබද්ධ කමිටුව ඇතුලු වෙනත් රේඛීය අමාත්‍යාංශ විසින් පවත්වන ලද ඒකාබද්ධ කමිටු සාකච්ඡා සඳහා වාණිජ දෙපාර්තමේන්තුව ක්‍රියාකාරීව සහභාගී විය.

### 4.4.1 ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර වෙළඳාම පිළිබඳ අනු කමිටුවෙහි පළමු රැස්වීම

ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර වෙළඳාම පිළිබඳ අනු කමිටුවෙහි පළමු රැස්වීම 2015 මාර්තු මස 26 වන දින කොළඹදී පවත්වන ලද අතර අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභ ලැබෙන පරිදි වාණිජ සහ ආර්ථික සබඳතා ශක්තිමත් කිරීමේ පරමාර්ථයෙන් සාකච්ඡා පැවැත්විණි. ශ්‍රී ලංකා දූත පිරිස කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් එස්. එස්. මියන්වල මහතා විසින් මෙහෙය වූ අතර වියට්නාම කර්මාන්ත හා වෙළඳ අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය Hoang Quoc Vuong මහතා වියට්නාම දූත පිරිස මෙහෙය විය. තාක්ෂණික සැසිවාරයේ සම අසුන් ගන්නා ලද්දේ වියට්නාමයේ කර්මාන්ත හා වෙළඳ අමාත්‍යාංශයේ නිරිතදිග ආසියානු සහ අප්‍රිකානු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ අධ්‍යක්ෂ ජනරාල් විසිනි.

වෙළඳ හා ආයෝජන ක්ෂේත්‍රයේ සහයෝගීතාව, මත්ස්‍ය ක්ෂේත්‍රය සඳහා සහයෝගීතාව, කාර්මික සහයෝගීතාව, රේගු හා තීරුබදු සහයෝගිතාවය සහ දෙරටෙහි අපනයන ප්‍රවර්ධන ආයතන අතර සහයෝගීතාව යනාදිය පිළිබඳ තාක්ෂණික සැසිවාරයේදී සාකච්ඡා සිදුකරන ලදී.

## 5. කලාපීය ආර්ථික සහයෝගීතාව

ශ්‍රී ලංකාව, ආසියා-පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA), දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA), දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA), බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන් (BIMSTEC) සහ ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA) වැනි කලාපීය වෙළෙඳ හා ආර්ථික ගිවිසුම් සම්බන්ධයෙන් ප්‍රධාන භූමිකාවක් හොබවන්නෙකු ලෙස කටයුතු කරයි.

### 5.1 ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA) යටතේ සාකච්ඡා පවත්වාගෙන යෑම

ආසියා පැසිෆික් කලාපය තුළ පිහිට වූ ප්‍රථම වෙළඳ ගිවිසුම වශයෙන් 1975 දී අත්සන් තබන ලද “බැංකොක් ගිවිසුම” 2005 දී ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම වශයෙන් නම වෙනස් කරන ලදී. එහි 3 වන අදියරේ සාකච්ඡා 2006 සැප්තැම්බර් 01 දින සිට බලාත්මකව ක්‍රියාත්මක කරන ලදී.

2015 වර්ෂයේ මාර්තු, ජූලි සහ දෙසැම්බර් දකුණු කොරියාවෙහි සහ තායිලන්තයෙහි පැවති APTA හි ස්ථාවර කමිටු සැසිවාර තුනකට ශ්‍රී ලංකාව සාර්ථකව සහභාගී විය. තායිලන්තයේ බැංකොක් හිදී 2016 වසරේදී පැවැත් වීමට නියමිත ආසියා-පැසිෆික් වෙළඳ ගිවිසුමේ අමාත්‍ය සභාවේ 4වැනි සැසිවාරය අතරතුරදී 4 වැනි අදියර සාකච්ඡා අවසන් කිරීමට සාමාජික රාජ්‍යයන් විසින් තීරණය කරනු ලැබ ඇත.

තීරුබදු සහන පුළුල් කිරීම, ප්‍රභවස්ථාන රීති (Rules of Origin) ලිහිල් කිරීම සහ වෙළඳාම් පහසුකරණය, ආයෝජනය සහ සේවා පිළිබඳ ගිවිසුම් රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා වන සැලැස්ම යනාදිය පිළිබඳ සාකච්ඡා, ස්ථාවර කමිටු රැස්වීම්වලදී අවධානය යොමුවූ ප්‍රධාන ක්ෂේත්‍රයන්ට ඇතුළත් විය.

ආසියා-පැසිෆික් වෙළඳ ගිවිසුමේ ස්ථාවර කමිටුවේ 45වැනි සැසිවාරයට සමගාමීව ආසියා-පැසිෆික් වෙළඳ ගිවිසුමේ ව්‍යාපාරික සංසදය (APTA Business Forum) පවත්වන ලදී. මෙම සංසදයේ ප්‍රධාන අරමුණ වූයේ, ආසියා-පැසිෆික් වෙළඳ ගිවිසුමේ ඉදිරි සැලැස්ම තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා වන අවශ්‍යතාව පිළිබඳව පෞද්ගලික අංශය අතර පොදු එකඟතාවක් ගොඩනැගීමයි.

සමාලෝචනය සිදු කරන වර්ෂය තුල ශ්‍රී ලංකාව ඇ. ඩො. මිලියන 118.69ක් වටිනා භාණ්ඩ APTA ගිවිසුම යටතේ අපනයනය කර ඇති අතර ඉන් 75% ක් චීනය වෙතද 23.6% ක් දකුණු කොරියාව වෙතද වේ. කෙසේ නමුත් APTA ගිවිසුම යටතේ ශ්‍රී ලංකානු ආනයන ඇ. ඩො. මිලියන 15.43ක් වාර්තා වී ඇති අතර ඉන් 88% ක් චීනයෙන් හා 12% ක් ඉන්දියාවෙන් විය.

### 5.2 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) යටතේ සාකච්ඡා පවත්වාගෙන යෑම

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) 2004 ජනවාරි මාසයේදී අත්සන් කරන ලද අතර, 2006 ජනවාරි 01 දින සිට බලාත්මකව ක්‍රියාත්මක කරන ලදී. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ අරමුණ වන්නේ, 1995 වර්ෂයේ දී දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) ස්ථාපිත කිරීමත් සමඟ ඇරඹි වරණීය වෙළඳ ප්‍රවර්ධනය තුළින් කලාපීය ආර්ථික ඒකීයකරණ වැඩසටහන තවදුරටත් වැඩි දියුණු කිරීමයි.

2016 වන විට වසර දහයක් තුළ නිමකිරීමට සැලසුම් කරන ලද දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ වෙළඳාම් ලිහිල්කරණ වැඩසටහන (Trade Liberalization Programme-TLP) යටතේ, කලාපීය රටවල නිෂ්පාදන මත අය කරනු ලබන තීරුබදු ප්‍රගතිශීලී ලෙස අඩු කරනු ලබනු ඇත. ශ්‍රී ලංකාව පළමු අදියර යටතේ සිය තීරු බදු ලිහිල්කරණය 2015 නොවැම්බර් මස සම්පූර්ණ කර ඇත. ඌණ සංවර්ධිත රටවල් 2016 වන විට එය සම්පූර්ණ කළ යුතුය.

දෙවන අදියරෙහි වෙළඳාම් ලිහිල්කරණ වැඩසටහන ද සාමාජික රාජ්‍යයන් අතර සාර්ථක ලෙස සාකච්ඡාවට ලක් වී ක්‍රියාත්මක වී ඇත. දෙවන අදියර යටතේ සාමාජික රාජ්‍යයන් ඔවුන්ගේ මූලික සංවේදී අයිතම ලැයිස්තුවෙන් 20%ක් අඩු කිරීමට එකඟ වී ඇත. සංවේදී අයිතම ලැයිස්තුවෙන් ඉවත් කරන ලද අයිතමයන්ගේ තීරුබදු අඩු වීම 2020 වන විට සම්පූර්ණ කිරීමට සැලසුම්කොට ඇති අතර එය ශ්‍රී ලංකාව විසින් 2018 වන විට සැපිරිය යුතුය.

2015 වසරේදී SAFTA සම්බන්ධ සහ කලාපයේ අභ්‍යන්තර වෙළඳාමේ ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීමට නිල මට්ටමින් සභාවාර තුනක් පවත්වන ලදී. මෙම සාකච්ඡාවන්හිදී අවධානය යොමු කෙරුන ප්‍රධාන කරුණු වන්නේ ප්‍රභවස්ථාන නීති සත්‍යාපනය කිරීම පිළිබඳ යාන්ත්‍රණයක් සැකසීම, අන්තර් කලාපීය වෙළඳාම වර්ධනය කිරීම සඳහා තීරුබදු ලිහිල් කිරීම සහ SAFTA හි අවසන් දැක්ම නිර්ණය කිරීමයි.

සමාලෝචනය සිදු කරන වර්ෂය තුල SAFTA ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ අපනයන ඇ. ඩො. මිලියන 15.4 වූ අතර 2014 වටිනාකමට සාපේක්ෂව 22% ක ඉහල යෑමක් වාර්තා විය. ඉන් 95% ක්ම ඉන්දියාවට කරනු ලැබූ අපනයනයන් වේ. කෙසේ නමුත් මෙම ගිවිසුම යටතේ සිදු කරනු ලබන ආනයනයන් සැමවිටම ඉතා සුළු අගයකින් යුතු වේ. SAFTA ගිවිසුම සඳහා පූර්වගාමී ගිවිසුම වූ SAPTA (දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම) යටතේ තවමත් අපනයනයන් වාර්තා වන අතර 2015 වර්ෂයේ දී එය ඇ. ඩො. මිලියන 2.9 ක් විය.

ඉන්දියාව සහ පකිස්ථානය යන සාර්ක් කලාපයේ අපගේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් සමග ශ්‍රී ලංකාව ඇතිකරගෙන ඇති ද්විපාර්ශවික ගිවිසුම් හේතුවෙන්, SAFTA යටතේ එම රටවලටම ඉතා විශාල අපනයන ප්‍රවාහයක් සාධ්‍ය කල නොහැකිය.

## 5.3 නව කලාපීය වෙළඳ ගිවිසුම් සඳහා වන සාකච්ඡා

### 5.3.1 බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන් (BIMSTEC)

බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන රටවල් හතකින් සමන්විත බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ (BIMSTEC) අරමුණ වන්නේ, සාමාජික රටවල් අතර වෙළඳ ප්‍රවාහයන් වැඩිදියුණු කිරිම සහ කලාපය තුළ වඩා හොඳ ආර්ථික සබඳතා ගොඩනැගීමයි.

තෙවැනි බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ සමුළුව, 14වැනි බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ අමාත්‍ය හමුව සහ 16 වැනි බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරි හමුව මාර්තු 1-4 දක්වා මියන්මාරයේ Nay Pyi Taw හිදී පවත්වන ලදී.

අමාත්‍ය හමුව අතරතුරදී, සාමාජික රටවල විදේශ අමාත්‍යවරුන් විසින් බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ ප්‍රමුඛතා ක්ෂේත්‍රයන්හි ප්‍රගතිය සමාලෝචනය කරන ලද අතර පහත සඳහන් සාධන පත්‍ර අත්සන් කිරීම සඳහා සිය කැමැත්ත පළ කරන ලදී;

- බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ ස්ථිර ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම පිළිබඳ සාංගමික සංස්ථා පත්‍රය
- බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ සංස්කෘතික කර්මාන්ත කොමිසමක් සහ බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ සංස්කෘතික කර්මාන්ත නිරීක්ෂණාගාරයක් ස්ථාපිත කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම
- කාලගුණය සහ දේශගුණය සඳහා බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ මධ්‍යස්ථානයක් පිහිටුවීමට අදාළව බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ සාමාජික රටවල් අතර සාංගමික සංස්ථා පත්‍රය

පහත සඳහන් ගිවිසුම් ඊළඟ වෙළඳ හා ආර්ථික අමාත්‍ය හමුව අතරතුරදී අත්සන් තැබීමට යෝජ්‍ය නිලධාරි හමුවේදී එකඟවන ලදී;

- බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ නිදහස් වෙළඳ ගිවිසුම (BIMSTEC FTA) සම්බන්ධයෙන් වන ගිවිසුම් රාමුවේ භාණ්ඩ වෙළඳාම පිළිබඳ ගිවිසුම
- බහු-ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයන්ගේ නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් වන ගිවිසුම් රාමුව සංශෝධනය සඳහා වන සන්ධාන ගිවිසුම
- ආරවුල් බේරුම්කිරීමේ ක්‍රියාපටිපාටි සහ ගිවිසුම් රාමුවේ යාන්ත්‍රණය පිළිබඳ ගිවිසුම
- රේගු කටයුතු සම්බන්ධයෙන් සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය ආධාර පිළිබඳ ගිවිසුම

ශ්‍රී ලංකාවේ වෙළඳාම ලිහිල්කරණ වැඩසටහන (TLP) පාර්ශවකරුවන්ගේ උපදේශකත්වය යටතේ සාමාජික රටවල් එකඟ වූ ආකෘතියකට අනුව සකස්කරන ලදී

වෙළඳාම ලිහිල්කරණ වැඩසටහනෙහි ආකෘතිය පහත පරිදි වේ :

| | අයිකම සංඛ්‍යාව | % | ඌන සංවර්ධිත නොවන රාජ්‍යයන් සඳහා | ඌන සංවර්ධිත රාජ්‍යයන් සඳහා |
|---|---|---|---|---|
| ඉක්මන් ඉවත්කිරීම (Fast Track Elimination -FTE) | 505 | 10% | සමාන වාර්ෂික වාරික 4 | සමාන වාර්ෂික වාරික 2 |
| සාමාන්‍ය ඉවත්කිරීම (Normal Track Elimination -NTE) | 2,422 | 48% | දෙවන වසරේ සිට සමාන වාර්ෂික වාරික 6 | දෙවන වසරේ සිට සමාන වාර්ෂික වාරික 4 |
| සාමාන්‍ය අඩු කිරීම (Normal Track Reduction -NTR - 1% to 5%) | 960 | 19% | දෙවන වසරේ සිට සමාන වාර්ෂික වාරික 6 | දෙවන වසරේ සිට සමාන වාර්ෂික වාරික 4 |
| තීරු බදු සහන නොමැති ලැයිස්තුව (Negative List-NL) | 1,165 | 23% | අදාල නොවේ | අදාල නොවේ |

ශ්‍රී ලංකාවේ වෙළඳාම් ලිහිල්කරණ වැඩසටහන සඳහා අමාත්‍යය මණ්ඩල අනුමැතිය 2016 පෙබරවාරි මස ලැබුණි.

BIMSTEC වෙළඳ සාකච්ඡා සම්මුති කමිටුවේ 20 වන සැසිවාරය 2015 සැප්තැම්බර් මස 7-9 දිනයන්හි දී තායිලන්තයේදී පැවැත්විණි. 2014 මින්මාරයෙහිදී පැවති තෙවැනි BIMSTEC සමුළුවෙහිදී සිදුකරන ලද මඟ පෙන්වීම යටතේ 20 වැන සාකච්ඡා කමිටු රැස්වීමේ ආසන්න අරමුණ වූයේ BIMSTEC නිදහස් වෙළඳ ගිවිසුමෙහි භාණ්ඩ වෙළඳාම් සඳහා වන ගිවිසුම නිමා කිරීමයි. වසර 4කට පෙර එකඟ වූ නිපැයුම් නිශ්චිත නීති (Product Specific Rules) ලැයිස්තුව නැවත සමීක්ෂණයක් සිදුකිරීමට අවශ්‍යය බවට ඉන්දියාව විසින් ප්‍රකාශ කර සිටි බැවින් භාණ්ඩ වෙළඳාම් පිළිබඳ ගිවිසුම අවසන් කිරීමට නොහැකි විය. මෙයට අමතරව ආයෝජන හා සේවා පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් ද පවත්වන ලදී

## 5.3.2 ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA)

ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (IORA) යනු, ඉන්දියානු සාගර වටද්දර රටවල් අතර සහයෝගීතාව සහ සමීප අන්තර් ක්‍රියාකාරීත්වයන් ප්‍රවර්ධනය කිරීම සඳහා එම රටවල රජය, ව්‍යාපාරික ප්‍රජාව සහ විද්වත් ප්‍රජාව යන ත්‍රෛපාර්ශ්වයන් එකට කැටුව පිහිටුවා ගන්නා ලද කලාපීය සංසදයකි. වෙළඳාම හා ආයෝජනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම (WGTI), ඉන්දියානු සාගර වටද්දර රටවල ව්‍යාපාරික සංසදය (IORBF) සහ ඉන්දියානු සාගර වටද්දර රටවල අධ්‍යයන කණ්ඩායම (IORAG) යනාදී වශයෙන්, පාර්ශ්ව කණ්ඩායම් සම්බන්ධයෙන් ක්‍රියාකාරී කණ්ඩායම් තුනක් මේ යටතේ පිහිටුවා ඇත. කලාපයේ සහ සාමාජික රාජ්‍යයන්ගේ තිරසාර වර්ධනය සහ තුලිත සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ කලාපීය ආර්ථික සහයෝගීතාව උදෙසා පොදු පදනමක් ඇතිකිරීම සඳහා ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය විසින්, (i) සමුද්‍රීය ආරක්ෂාව සහ සුරක්ෂිතතාව, (ii) වෙළඳාම් සහ ආයෝජන පහසුකරණය, (iii) ධීවර කළමනාකරණය, (iv) ආපදා අවදානම් කළමනාකරණය, (v) අධ්‍යයන, විද්‍යා හා තාක්ෂණ, (vi) සංචාරක හා සංස්කෘතික හුවමාරු (vii) කාන්තා සවිබල ගැන්වීම් සහ (viii) සමුද්‍රීය ආර්ථික යනාදී ප්‍රමුඛ ක්ෂේත්‍ර හඳුනාගෙන ඇත.

2015 ඔක්තෝබර් මස 20-23 යන දිනයන්හිදී ඉන්දුනීසියාවේ දී අමාත්‍ය සභාවේ 15 වන සභාවාරය හා ආශ්‍රිත හමු පවත්වන ලදී. ඉන්දියානු සාගර ව්‍යාපාර සමුළුවෙහි (IORBF) 21 වන සභා වාරය ජකර්තාහිදී පවත්වන ලදී. ඉන්දියානු සාගර වටද්දර රටවල අධ්‍යයන කණ්ඩායමෙහි (IORAG) 21 වන සභා වාරය, වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ වැඩ කණ්ඩායම් හි (WGTI) 15 වන රැස්වීම, ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ (CSO) 17 වන කමිටු රැස්වීම සහ අමාත්‍ය කවුන්සිලයේ 15 වන සභා වාරය පදන්ග් හි පැවැත්විය. වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ වැඩ කණ්ඩායම් හි (WGTI) රැස්වීම අතරවාරයේ “Prospectus of Blue Economy in the Indian Ocean” යන අධ්‍යයන වාර්තාවක් ඉන්දියාව විසින් ඉදිරිපත් කරන ලදී.

තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා, සමුද්‍රීය යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමට, නාවික සහ සැපයුම් මෙන්ම ඒ හා සමාන කර්මාන්ත අතර සහයෝගය වර්ධනය, තිරසාර සහ මත්ස්‍ය කළමණාකරණය තුළින් ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම ජාත්‍යන්තර නීතිය අනුව නාවික කටයුතු සම්බන්ධයෙන් ඇති අභියෝග සඳහා කලාපීය සහයෝගිතා ශක්තිමත් කිරීම සහ පර්යේෂණ ආයතන සහ සාගර ගැටලු අතර සබඳතාවය ඉහල දැමීම ආදී කටයුතු අමාත්‍යවරුන් විසින් සම්මත කරන ලදී.

### 5.3.3 සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS)

2010 අප්‍රේල් මාසයේදී භූතානයේදී පවත්වන ලද 16 වැනි සාර්ක් සමුළුව අතර තුරදී සාමාජික රාජ්‍යයන්ගේ නායකයින් විසින් සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම අත්සන් කරන ලදී. සියලුම රටවල් මෙම ගිවිසුම සඳහා එකඟතාව පළ කරන ලද අතර සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම යටතේ පවත්නා ජාතික බැඳීම් උපලේඛන සැකසීමේ ක්‍රියාවලියෙහි නිරතවන ලදී.

වර්ෂය තුළදී SATIS හි විශේෂඥ කණ්ඩායමේ 11 වන රැස්වීම පැවැත්වූ අතර සියලු සමාජික රටවල් තම අවසන් යෝජනා ලැයිස්තු ඒ වන විට සකසා නොමැති බව දක්නට ලැබුණි. ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව සහ නේපාලය විසින් සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම යටතේ යෝජනා ලැයිස්තු දැනටමත් අවසන් කරනු ලැබ ඇත. පකිස්ථානය සහ ශ්‍රී ලංකාව සිය බැඳීම් උපලේඛන අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බවට දැනුම් දී ඇති අතර මාලදිවයින තවමත් උපදේශනාත්මක සාකච්ඡා සිදුකරමින් ඇති බවට ප්‍රකාශ කරන ලදී.

ශ්‍රී ලංකාවේ බැඳීම් උපලේඛනය පාර්ශවකරුවන් සමඟ තවදුරවත් සිදුකරන ලද සාකච්ඡා වලින් පසුව අමාත්‍ය මණ්ඩලය වෙත දෙවන වර ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කර ඇත.

# 6. වෙළඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනය

## 6.1 විදේශ වාණිජ නියෝජනය

විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩල 25ක නිලධාරින් 27 දෙනෙකුගෙන් සමන්විත වාණිජ දෙපාර්තමේන්තුවේ වාණිජ නියෝජනය මගින් වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සත්කාරක රටවල ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කිරිම සහ ආරක්ෂා කිරීමෙහිලා නිරත වෙයි. "රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව වැඩසටහන" යටතේ වාණිජ නිලධාරින් විසින් ක්‍රියාකාරකම් පුළුල් පරාසයක් ක්‍රියාවට නංවනු ලැබේ. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ජාත්‍යන්තර වෙළඳපළ තවදුරටත් පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරීම සඳහා, විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවයෙහි යොදවා ඇති වාණිජ නිලධාරීන්ගේ සහ ශ්‍රී ලංකාවේ පිහිටි අනෙකුත් සහාය ව්‍යාපාරික සංවිධානවල සහයෝගය ඇතිව, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරකම් පෙළක් ක්‍රියාවට නංවන ලදී. නව අපනයන වෙළඳපළ හඳුන්වාදීම සහ පවත්නා වෙළඳපළවල වඩාත් යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම තුළින් ජාත්‍යන්තර වෙළඳපළ තුළ ඔවුනගේ වෙළඳපළ කොටස පුළුල් කිරීම සඳහා ප්‍රමුඛ අපනයනකරුවන් වෙත මූලික අවධානය යොමුකරන අතරතුර, වාණිජ නිලධාරීන් විසින් සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් වෙත ඔවුන්ගේ නිෂ්පාදන වෙනුවෙන් ජාත්‍යන්තර වෙළඳපළ ප්‍රවේශයක් ලබාගැනීම සඳහා අඛණ්ඩව සහයෝගය දක්වන ලදී.

විදේශයන්හි සිටින වාණිජ නිලධාරීන් විසින් ඉටුකරන ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- WTO, CFC, UNCTAD යනාදී බහුපාර්ශවීය සංවිධාන සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සහ ද්විපාර්ශවීය, කලාපීය ප්‍රතිපත්ති සැකසීමට දායක වීම.
- වෙළඳ සහ ප්‍රවර්ධන සාකච්ඡා නියෝජනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමට මෙන්ම අධීක්ෂණය සඳහා දායක වීම.
- ප්‍රභවස්ථාන නීති සහ නිෂ්පාදන සම්භවය පිළිබඳ ගැටලු සඳහා දායක වීම, වාණිජ දේශසීමා සහ ආර්ථික අවශ්‍යතා ආරක්ෂා කිරීම මෙන්ම නියෝජන කටයුතු සහ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.
- අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය වැනි දේශීය ආයතනයන හා සම්බන්ධව වාණිජ සහ ආර්ථික කටයුතු ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය අන්තර් සම්බන්ධතාවයන් ගොඩ නැංවීමට කටයුතු කිරීම.
- සත්කාරක රටවල වෙළඳ, ආයෝජන සහ සංචාරක ක්ෂේත්‍ර වලට අදාළ රජයේ නිලධාරීන් ජාලගත කිරීම සහ ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු වලට අදාළ ගැටළු/කරුණු සම්බන්ධයෙන් විවිධ රාජ්‍ය සහ ජාත්‍යන්තර සංවිධාන වලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.
- සත්කාරක රටෙහි වෙළඳ ප්‍රතිපත්ති වෙනස්කම්, විශේෂයෙන් තීරුබදු සහ තීරුබදු නොවන ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම.
- සත්කාරක රටවලදී ශ්‍රී ලංකා-විශේෂී (තනි-රට) ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම.
- වැදගත් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන/අවස්ථා සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම. මෙය, ශ්‍රී ලාංකික අපනයන ප්‍රවර්ධනය කිරීමෙහිලා වඩාත් ඵලදායී මෙවලමක් වශයෙන් සළකනු ලැබේ.
- ශ්‍රී ලංකාවේ පවත්වන ප්‍රදර්ශන/අවස්ථා සඳහා විදේශීය ව්‍යාපාරික දූත පිරිස් සහභාගීත්වය සංවිධානය කිරීම.

- ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත වෙළඳ, ආයෝජන සහ සංචාරක දූත පිරිස් සංවිධානය කිරීම.
- ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත පුද්ගල ව්‍යාපාරික සංචාරයන් සංවිධානය කිරීම.
- නව වෙළඳපොල සෙවීම, වෙළඳපොල පර්යේෂණ පැවැත්වීම, වෙළඳපොල තොරතුරු සහ නිෂ්පාදන තොරතුරු බෙදාහැරීම සහ සමීක්ෂණ පැවැත්වීම යනාදී කටයුතු සිදු කිරීම.
- වෙළඳ, ආයෝජන සහ සංචාරක ආශ්‍රිත වෙළඳ විමසුම් සම්බන්ධයෙන් සේවය සැපයීම, විදේශ ව්‍යාපාරිකයින් හමුවීම/ සාකච්ඡා පැවැත්වීම, ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා තාක්ෂණික සහාය ලබාදීම සහ වෙළඳ ආරවුල් විසඳීම යනාදිය.
- තාක්ෂණ හුවමාරු කරගැනීම සඳහා සහාය සහ වෙළඳපොල සංවර්ධන වැඩසටහන් සඳහා සහාය ලබාදීම සහ තාක්ෂණික සහාය ලබාදීම.
- නව භාණ්ඩ සත්කාරක රටවල්වලට පිවිසීමේදී ඒ සඳහා අවශ්‍ය නිරෝධායන කාර්යයන් සිදු කිරීම.
- ශ්‍රී ලංකා රජයේ ටෙන්ඩර් සඳහා සත්කාරක රටෙහි ප්‍රචාරණ කටයුතු සිදු කිරීම.

2011 සිට 2015 දක්වා කාලය තුල වාණිජ නිලධාරීන් විසින් සිදුකරන ලද මෙවැනි ආකාරයේ ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

| ක්‍රියාකාරකම් | 2011 | | 2012 | | 2013 | | 2014 | | 2015 | | එකතුව (2011-2015) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගිවූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගිවූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගිවූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගිවූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගිවූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව | ප්‍රදර්ශන/ දූත පිරිස් සංඛ්‍යාව | සහභාගිවූවන්/ නියෝජිතයින් සංඛ්‍යාව |
| ප්‍රවර්ධන සල්පිල් සඳහා සත්කාරක රට වෙත ශ්‍රී ලංකාවෙන් සහභාගීත්වය | 59 | 671 | 80 | 728 | 75 | 848 | 61 | 737 | 131 | 1,071 | 406 | 4,055 |
| ප්‍රවර්ධන සල්පිල් සඳහා ශ්‍රී ලංකාව වෙත සත්කාරක රටෙහි සහභාගීත්වය | 26 | 90 | 29 | 122 | 37 | 325 | 22 | 169 | 116 | 131 | 230 | 837 |
| ශ්‍රී ලංකාවේ එක්ස්පෝ - 2012 සඳහා සහභාගීත්වය | අදාල නොවේ | අදාල නොවේ | 01 | 1,160 | අදාල නොවේ | අදාල නොවේ | අදාල නොවේ | අදාල නොවේ | අදාල නොවේ | අදාල නොවේ | 1 | 1,160 |
| සත්කාරක රටවලදී ශ්‍රී ලංකා-විශේෂී (තනි-රට) ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම | 116 | | 138 | | 127 | | 33 | | 63 | | 477 | |
| ශ්‍රී ලංකාව වෙත දූත පිරිස් පැමිණීම (එක්ස්පෝ- 2012 සඳහා හැර) | 43 | 282 | 48 | 457 | 98 | 563 | 35 | 387 | 57 | 518 | 281 | 2,207 |
| සත්කාරක රට වෙත සංචාරය කළ දූත පිරිස් | 61 | 436 | 54 | 455 | 70 | 600 | 78 | 805 | 74 | 814 | 337 | 3,110 |
| සත්කාරක රට වෙත පුද්ගල සංචාරයන් | 174 | | 181 | | 201 | | 280 | | 141 | | 977 | |
| ශ්‍රී ලංකාව වෙත පුද්ගල සංචාරයන් | 139 | | 194 | | 270 | | 237 | | 153 | | 993 | |
| ද්වි මාර්ගික වෙළඳ විමර්ශන පිළිතුරු ලබාදීම | 1,751 | | 1,882 | | 2,133 | | 2,132 | | 2,713 | | 10,611 | |

### 6.1.1 කාර්ය සාධන ඇගයීමේ ක්‍රියාමාර්ගයන්

1. *අපනයන ප්‍රවර්ධනය*

වාණිජ දූත මණ්ඩල නිලධාරින් විසින් ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් මුණගැස්වීමේ අන්තර් සම්බන්ධතාවය සිදු කිරීමට අමතරව විදේශ ඇණවුම් සුරක්ෂිත කිරීමේ සාර්ථකත්වය පහත කරුණු මත රඳා පැවතෙනු ඇත. එම කරුණු සඳහා වාණිජ නිලධාරින් හට මැදිහත් වීමක් සිදු කළ නොහැකිය.

| සුක්ෂම කරුණු | සාර්ව කරුණු |
|---|---|
| සමාගමෙහි සාමාන්‍ය අපනයන සූදානම/ උනන්දුව | තරගකාරී අ්රථිකය තුල අඩු නිෂ්පාදන පිරිවැය |
| තරගකාරී මිල (වෙනත් සැපයුම්කරුවන් හා තරග කිරීම) | තාක්ෂණ සඳහා සිදුකරන ආයෝජන මට්ටම සහ නව නිපැයුම් මට්ටම |
| නිෂ්පාදනයේ ගුණාත්මක භාවය | රටෙහි සම්පත් උරුමය |
| සැපයුම් ධාරිතාවය- විශාල ඇණවුම් ප්‍රමාණයක් කළට වේලාවට සහ අඛණ්ඩව සම්පූර්ණ කිරීමේ හැකියාව | වෙළඳ පහසුකම් මට්ටම |
| ආනයන රටවල පවත්නා නීති රීතින්ට අනුකූළ වීම | අයවැය හැකියාව |
| මූල්‍ය ප්‍රවර්ධන හැකියාව | |

රටක ඉහත සඳහන් කරන ලද සූක්ෂම සහ සාර්ව කරුණු හිතකර අයුරෙන් පැවතීම වාණිජ නිලධාරින්ගේ කර්තව්‍ය වඩාත් කාර්යක්ෂම කරනු ඇත.

2. *ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනය*

ඉහත අපනයන ප්‍රවර්ධනය සඳහා වාණිජ නිලධාරින්ගේ මැදිහත්වීම හා සමානවම, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධනයෙහිදී ද වාණිජ නිලධාරින් දේශීය ආයෝජන සහ සංචාරක අවස්ථා හඳුන්වා දීම සිදු කළද එහි අවසානය දක්වා ඍජු මැදිහත්වීමක් සිදු කළ නොහැක.

උක්ත කරුණු හේතුවෙන් වාණිජ නිලධාරින්ගේ කාර්ය සාධන අගය කිරීම ආයෝජන හා අපනයන වටිනාකම්හි වර්ධනයක් ලෙසින් අගය කළ නොහැකි අතර එම නිලධාරින් විසින් ඉහත අන්තර් සම්බන්ධතාවයන් සඳහා සත්කාරක රටෙහිදී ගනු ලබන ප්‍රමාණාත්මකවූත් කාලීනවූත් වෘතියමය දායකත්වය මත එය අගය කළ යුතු වන්නේය.

විදේශයන් හි සිටින වාණිජ නිලධාරීන් විසින් ඉටුකරන ලද ප්‍රධාන නියෝජන කාර්යන්:

- ලෝක වෙළඳ සංවිධානයේ TRIPS ගිවිසුම යටතේ භූගෝලීය දර්ශකයක් වන ශ්‍රී ලාංකික තේ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජාතික නීති රීති සම්පාදනයෙහිලා කටයුතතු කිරීම සහ ශ්‍රී ලංකික කුරුඳු සඳහා විශේෂ වර්ගීකරණයක් වන HS වර්ගීකරණය 2007 සිට බලාත්මක වන පරිදි ලබාගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම.
- කුරුඳුවලට සල්ෆර් ඩයොක්සයිඩ් එක්වීම සම්බන්ධයෙන් යුරෝපීය කොමිසම මඟින් නැගුණ චෝදනා මත ශ්‍රී ලංකා කුරුඳුවලට පැනවූ නිළ නොවන තහනම ඉවත් කිරීම සඳහා සල්ෆර් ඩයොක්සයිඩ් (SO2) ආහාර ආකලනයන් ලෙස කුරුඳු සඳහා භාවිත කිරීම සම්බන්ධයෙන් තත්ත්වයන් වැඩිදියුණු කිරීම පිළිබඳව ජාත්‍යන්තර තත්ත්ව සහතිකයක් වැඩි දියුණු කිරීම සඳහා රෝමයෙහි පිහිටි ඇලිමෙන්ටේරියස් කෝඩෙක්ස් කමිටුවට (Codex Alimantarius Commission) යෝජනාවලියක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.
- කුඩා සහ අවධානමකින් පෙලෙන රටක් ලෙස කෘෂිකාර්මික සාකච්ඡා සඳහා ද කෘෂිකාර්මික නොවන සාකච්ඡා සම්බන්ධයෙන් සමානුපාතික නොවන ලෙස බලපාන රටක් ලෙස ලෝක වෙළඳ සංවිධානයේ සිදුකෙරෙමින් පවතින දෝහා සාකච්ඡාවන්හි ශ්‍රී ලංකාව ස්ථාපිත කිරීම.
- ලෝක වෙළඳ සංවිධානයේ 1998, 2003 සහ 2010 ට අදාල වෙළඳ ප්‍රතිපත්ති විමසුම් වාර්තා සම්පාදනය කිරීමේ මූලිකයා ලෙස ද 2016 ශ්‍රී ලංකාවේ වාර්තාව සම්පාදනය කිරීමේ කටයුතු කිරීම.
- WTO XXVIII වගන්තිය සම්බන්ධයෙන් ලෝක වෙළඳ සංවිධානයේ කිරිපිටි අයිතමය සඳහා අභිරුචිය ඇති සාමාජික රාජ්‍යයන් සමඟ අවශ්‍යය සාකච්ඡා නිම කිරීමෙන් පසු ලෝක වෙළඳ සංවිධානයට වන ශ්‍රී ලංකාවේ තීරුබදු බැදියාව ඇතුළත් ශ්‍රී ලංකාවේ තීරුබදු ක්‍රමය සකසා නිම කිරීම.
- 2004 වර්ෂයේ යුරෝපා සංගමයෙන් කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා විශේෂිත දීමනා ක්‍රමයන් ලබාගැනීම සඳහා වූ ක්‍රියාවලියට, 2005, 2008 වර්ෂයේ සහ වර්තමානයේ සකස්වෙමින් පවතින යුරෝපා සංගමයේ GSP+ වෙළඳ සහනයන් නැවත ලබාගැනීම සඳහා නායකත්වය සැපයිම.
- යුරෝපා සංගමය මඟින් යුරෝපා සංගමයේ නීතිවිරෝධී, විධිමත් නොවන සහ වාර්තා නොවූ මත්ස්‍ය නීතිරීති (EU-IUU) යටතේ ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදන ආනයන සඳහා පනවන ලද තහනම ඉවත් කිරීම සඳහා 'ඉදිරි සැලසුම්' සම්පාදනය කිරීම සහ පහසුකම් සැපයීම.
- ශ්‍රී ලංකාවේ පළතුරු, එළවළු සහ අනෙකුත් පැළ යුරෝපා සංගමය වෙත අපනයනය සඳහා යහපත් තත්ත්වයකින් යුත් ශාක සඳහා වන සහතිකය සම්බන්ධව පැනනගින ගැටළු සම්බන්ධයෙන් විශ්ලේෂණය කිරීම සහ ඉතා කෙටි කාලයකින් ඒ හා සම්බන්ධ ගැටළු සඳහා ක්‍රියාකාරී සැලසුමක් සැකසීම.
- ප්‍රධාන US-GSP ප්‍රතිලාභීන් සමඟ ක්‍රියාකාරීව සහභාගී වී එම GSP වැඩසටහන කඩිනමින් නැවත සම්පාදනය කිරීම සඳහා ඇමරිකානු කොන්ග්‍රසයේ සභිකයන් පෙළඹවීම.
- ලෝක වෙළඳ ප්‍රදර්ශන සහ වෙනත් වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කිරීම.
- ඇමරිකා එක්සත් ජනපදයේ, මාර්ගයේ නොදිවෙන සුලං පිරවිය හැකි නව ටයර් (Off Road Tyres) පිළිබඳ ප්‍රතිතෝලන විමර්ශණයන් සිදු කිරීම.

## 6.2 සෘජු විදේශ ආයෝජන (FDI) ප්‍රවර්ධනය

විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා වාණිජ දූත මණ්ඩල විදේශීය සෘජු ආයෝජන රටට ආකර්ෂණය කර ගැනීමෙහිලා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි. මෙනයින් බලන කළ විදේශීය ආයෝජකයින් සමඟ මෙන්ම විදේශ රටවල ආයෝජන ප්‍රවර්ධන ආයතන සමඟද ශක්තිමත් ජාලයක් පවත්වා ගැනීමෙහිලා වාණිජ නිලධාරීන් නිරත වේ. තවද ඔවුන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත පුළුල් කිරීම සඳහා ඒකාබද්ධ ව්‍යාපාරික අවස්ථාවන් / ව්‍යාපාර සහකරුවන් හඳුනා ගැනීම අරමුණු කරගනිමින් ශ්‍රී ලංකාවෙන් පැමිණෙන ව්‍යාපාරික දූත පිරිස් වෙනුවෙන් ව්‍යාපාරික රැස්වීම් ද සංවිධානය කරනු ලබයි. එමෙන්ම වාණිජ නිලධාරීන් විසින් සත්කාරක රටෙහි විභව ආයෝජකයින් හමුවී දිවයිනෙහි පවත්නා ආයෝජන අවස්ථාවන් පිළිබඳ සාරාංශගත විස්තර සැපයීම ද නිරන්තරයෙන් සිදු කරයි.

2015 වර්ෂය තුලදී වාණිජ නිලධාරීන් වෙත විදුලි බල හා බලශක්ති, පුනර්ජනනීය බලශක්ති, ජීව වායු, දේපොල සංවර්ධනය, ලෝහ සැකසුම්, ටයර්, ලී බඩු, ඇඟලුම් නිෂ්පාදන, සංචාරක යටිතල පහසුකම් සංවර්ධන, දුම්රිය යටිතල පහසුකම් සංවර්ධන, මත්ස්‍ය සැකසුම්, ආහාර සැකසුම්, කෘෂිකර්ම හා කාබනික ගොවිතැන, සෞඛ්‍ය සේවා, නිවාස සත්කාරක සේවා, ඖෂධ, තොරතුරු තාක්ෂණ, අප ජල පිරියම් හා ජල පිරිපහදු, ඉදිකිරීම්, සංචාරක, වාහන එකලස් කිරීම් යනාදී ක්ෂේත්‍රයන්හි විදේශීය ආයෝජකයන්ගෙන් ආයෝජන යෝජනා 81ක් ලැබී ඇති අතර වාණිජ නිලධාරීන් විසින් ඔවුනට අවශ්‍ය මඟ පෙන්වීම් සිදුකර ඇත.

## 6.3 සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම

වාණිජ නිලධාරීන් විසින් සංචාරක ක්ෂේත්‍රය තුළ පවත්නා සුවිශාල ශක්‍යතාවන් හඳුනාගනිමින්, ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයේ සහ ශ්‍රී ලංකන් ගුවන් සේවයේ සහාය ඇතිව විදේශ රටවල් තුළ විවිධ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කරනු ලැබ ඇත. විශේෂ සංසද සහ සම්මේලන සංවිධානය කිරීම, ශ්‍රී ලංකා ප්‍රවර්ධන අංගයන් සංවිධානය කිරීම, ජාත්‍යන්තර සංචාරක සල්පිල් වෙත සහභාගීවීම සඳහා පහසුකම් සැලසීම, ශ්‍රී ලංකාව වෙත මාධ්‍ය දූත පිරිස් සහ FAM සංචාරයන් සංවිධානය කිරීම, සංචාරක ප්‍රවර්ධන සභා ස්ථාපිත කිරීම සහ සත්කාරක රටෙහි විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ප්‍රචාරයන් ලබාදීම ආදිය ශ්‍රී ලංකාව එලෙස ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා වාණිජ නිලධාරීන් විසින් අනුගමනය කරන ලද ප්‍රධාන ක්‍රමෝපායන්ට ඇතුළත් වේ.

## 6.4 වෙළඳ, ආයෝජනය සහ සංචාරක කටයුතු පිළිබඳ විමසීම් සපුරාලීම

වාණිජ දෙපාර්තමේන්තුව සහ වාණිජ නිලධාරීන් දේශීය හා විදේශීය ව්‍යාපාරිකයන්ගේ වෙළඳාම පිළිබඳ පැන නගින්නා වූ ප්‍රශ්න සඳහා විසඳුම් ලබාදීමට විශාල සේවයක් ඉටු කරයි. විදේශ රටවල ස්ථාපිත වාණිජ දූත මණ්ඩල විදේශ පාර්ශව කරුවන්ගේ වෙළඳ විමසීම් මෙන්ම ආයෝජන සහ සංචාරක කටයුතු සම්බන්ධ විමසීම් සඳහා ද සහභාගී වෙයි. සමාලෝචනය සිදු කරන කාල සීමාව තුළ වාණිජ නිලධාරීන් වෙත එවැනි ගැටලු ආසන්න වශයෙන් 2,700 ක් ලැබුණ අතර ශ්‍රි ලංකාව ආකර්ෂණීය ආයෝජන සහ සංචාරක ගමනාන්තයක් වශයෙන් ද ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශීය වෙළඳපොළෙහි ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ද ඇතිව එම විමසීම් සඳහා වාණිජ නිලධාරීන් විසින් සුදුසු මග පෙන්වීම් ලබා දී ඇත.

විදේශීය ගැනුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති එවැනි වෙළඳ විමසීම් සඳහා ඉක්මන් පියවර ගැනීමට අදාල ශ්‍රී ලාංකීය අපනයනකරුවන් වෙත සෘජුවම මෙන්ම වාණිජ මණ්ඩල, අපනයන

සංවර්ධන මණ්ඩලය වැනි ආයතන වෙත ද භාරදෙයි. එමෙන්ම වෙළඳ මණ්ඩල, අපනයන සංවර්ධන මණ්ඩලය ආදී ආයතනවල සාමාජිකයන්ගෙන් / අපනයනකරුවන්ගෙන් ලැබෙන විමසීම්වලට අදාල විදේශීය ගැණුම්කරුවන් සොයාගැනීම සඳහා ද වාණිජ නිළධාරීන් තම සහය ලබා දෙයි.

එමෙන්ම ආයෝජනය සහ සංචාරක කටයුතු සම්බන්ධයෙන් වාණිජ නිළධාරීන් වෙත ලැබෙන විමසීම්වලට ඔවුන් විසින්ම සුදුසු පරිදි සහය සහ තොරතුරු ලබාදීම මෙන්ම ශ්‍රී ලංකාවෙහි අදාල ආයතන/අමාත්‍යාංශ වෙත යොමු කිරීම ද සිදු කරයි.

## 6.5 වෙළඳ ගැටලු / ආරවුල් විසඳීම සඳහා සහය

අපනයන හා ආනයන කරුවන් අතර ඇතිවන වෙළඳ ආරවුල් සුහදශීලී අයුරින් විසඳා ගැනීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් මැදිහත් වීමක් සිදු කරයි. එලෙස ගනු ලබන පියවර අතිශයින්ම අපක්ෂපාතී සහ සුහදශීලී මෙන්ම අනොන්‍යව ගිවිසගත් දෑ නිරවුල් කිරීම අරමුණු කොටම සිදුකරනු ලබයි.

සමාලෝචනය සිදුකරන කාල සීමාව තුළ එවැනි වෙළඳ ගැටලු 78 ක් සඳහා වාණිජ නිළධාරීන් මැදිහත් වී ඇති අතර වාණිජ දෙපාර්තමේන්තුව ද එවැනි ගැටලු 77 ක් ලැබී අදාල පාර්ශවයන් අතර සුහදශීලී විසඳුම් ලබාදීමේ අපේක්ෂාවෙන් කටයුතු කර ඇත. එම ආරවුල්වලින් 50% ක් පමණ සුහදශීලී විසඳුම්වලට එළඹීමට හැකි වී ඇත.

## 6.6 වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගීත්වය

කාර්මික තාක්ෂණය ඉහළයෑම සහ තොරතුරු හුවමාරුව සඳහා වන විශේෂිත අවශ්‍යතාවලට අනුකූලව “වෙළඳ ප්‍රදර්ශන” හුදු කුඩා සල්පිල් මට්ටමේ සිට අත්‍යවශ්‍ය තොරතුරු හුවමාරු මාර්ගයක් මෙන්ම වෙළඳ පාර්ශව වලට හමුවියහැකි ඵලදායී වෙළඳ මධ්‍යස්ථාන මට්ටම දක්වා වර්ධනය වී ඇත. ඉතා කාර්යක්ෂම හා ඵලදායී ප්‍රවර්ධන මෙවලමක් ලෙස වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගිත්වයේ වැදගත්කම හඳුනාගනිමින් වාණිජ නිළධාරීන් සමාලෝචනය සිදු කරන කාල සීමාව තුළ සත්කාර රටවලදී පවත්වන ලද වෙළඳ ප්‍රදර්ශන 131 ක් සඳහා කාලීන ප්‍රචාරණයන් ලබාදීම තුලින් ශ්‍රී ලාංකික ප්‍රදර්ශනකරුවන් / නරඹන්නන් දහසකට වැඩි ප්‍රමාණයක් එම වෙළඳ ප්‍රදර්ශණ සඳහා සහභාගී කරවා ගැනීමට සමත් වී ඇත. මෙම ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කිරීමේ දී ශ්‍රී ලාංකික ප්‍රදර්ශනකරුවන්ට වෙළඳ ප්‍රදර්ශන කුටි නොමිලේ ලබා ගැනීමට ද වාණිජ නිළධාරීන්ට හැකියාව ලැබී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවට අවම පිරිවැයකින් ආකර්ෂණීය ප්‍රදර්ශන කුටි සැකසීමට හැකි වී ඇත.

තවද වාණිජ නිළධාරීන් විසින් ශ්‍රී ලංකාවේ පැවති වෙළඳ ප්‍රදර්ශන සහ සල්පිල් සඳහා ද පුළුල් ප්‍රචාරණයක් සිය සත්කාරක රටවලදී ලබාදීම සිදු කරන ලදී. මෙම පුළුල් ප්‍රචාරණ කටයුතු මගින් ශ්‍රී ලංකාවේ පැවති වෙළඳ ප්‍රදර්ශන / සල්පිල් සඳහා විදේශීය ගැණුම්කරුවන්ගේ සැලකිය යුතු සහභාගිත්වයක් තහවුරු කරගැනීමට හැකි වී ඇත.

ශ්‍රී ලංකාවේ සහ විදේශීය රටවල පැවති වෙළඳ ප්‍රදර්ශන සඳහා කාලීන ප්‍රචාරණයන් ලබාදීමට අමතරව වාණිජ නිළධාරීන් සිය සත්කාරක රටවල පැවැත්වෙන වෙළඳ ප්‍රදර්ශන නැරඹීම සඳහා ද නිරන්තරයෙන් සහභාගී වෙයි. මෙම කාලසීමාවෙහිදී වාණිජ නිළධාරීන් විසින් එවැනි වෙළඳ ප්‍රදර්ශන / සල්පිල් 137 කට සහභාගී වී ව්‍යාපාරික සම්බන්ධතා 600 කට වඩා වැඩි ප්‍රමාණයක් ගොඩනගාගෙන ඇත.

## 6.7 2015 මිලාන් හි පැවති World EXPO සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය

"World EXPO" ලෙසින් නම්කර ඇති ලෝක ප්‍රදර්ශනය ඉතාලියෙහි මිලාන් නගරයෙහි සය මසක වැඩසටහනක් ලෙස 2015 මැයි මස 1 වන දින සිට ඔක්තෝබර් මස 31 වන දින තෙක් පැවැත්විණි. අමාත්‍ය කමිටුව මගින් මේ සඳහා පත් කරන ලද ප්‍රධාන ආයතනය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වන අතර ඒ සමග ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකන් ගුවන් සේවය සහ ජාතික ශිල්ප සභාව එක්ව එහි සම්බන්ධීකරණ කටයුතු වාණිජ දෙපාර්තමේන්තුව සහ රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් සිදුකරන ලදී.

වර්ගමීටර 250 ක පොකුරු මණ්ඩපයක් කිසිදු පිරිවැයකින් තොර පදනමට ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය කාර්යාලය සහ ශ්‍රී ලංකා ඉතාලි තානාපතිගේ මැදිහත්වීමෙන් ශ්‍රී ලංකාවට ලැබුණු අතර එම මණ්ඩපය "Fruits & Legumes" ලෙස නම් කර ඇත. සංවිධානය සඳහා රු. මිලියන 49.4 ක සැබෑ වියදමක් දරන ලද අතර ඇස්තමේන්තුගත අයවැය වූයේ රු. මිලියන 71.25 කි.

මෙම ප්‍රදර්ශනයේ සාර්ථක ප්‍රතිඵල පහත පරිදි වේ;

1. ප්‍රදර්ශනකරුවන් ලෙස ශ්‍රී ලාංකීය සමාගම් 29 ක් වැඩසටහන මුළුල්ලේම සහභාගී වූ අතර ඔවුන්ගේ නිෂ්පාදන වටමාරු පදනමින් ඉදිරිපත් කළහැකි විය.

2. ශ්‍රී ලංකා මණ්ඩපයේ නරඹන්නන් 700,000 පමණ විය.

3. ශ්‍රී ලංකා සංචාරක කටයුතු සමඟ ඉතාලියේ වෙළපොළ නායකත්වය ඇති ඉතාලි-ඇල්පිටුවර් (Italy-Alpitours) සංචාරක සමාගම ඩොලර් මිලියන 1.3 වටිනා ප්‍රඥප්තියක් ඇතිකර ගැනීම.

4. අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති සහ ප්‍රධාන විධායක බන්ධුල එගොඩගේ මහතාගේ මූලිකත්වයෙන් 2015 මැයි මස 22 දින "Sri Lanka the Ethical Sourcing Destination" යනුවෙන් මාධ්‍ය හමුවක් පැවැත්විය.

5. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආරාධනාව මත Calzedonia S P A (Omega Line දේශීය ආයතනය) හි කළමනාකරණ අධ්‍යක්ෂ Marco Carletto මහතා ශ්‍රී ලංකාවේ සාර්ථකව ව්‍යාපාර සිදුකරගෙන යෑම පිළිබඳ දේශනයක් සිදු කරන ලදී.

6. මාතලේ ව්‍යාපාර කටයුතු කරන ශ්‍රී ලංකාවේ මැණික් අපනයන කරුවකු මිලානෝහි පැවති එක්ස්පෝ මැදිරියෙහි ප්‍රදර්ශනය කිරීමෙන් අනතුරුව රුපියල් මිලියන 53 ක නිල් මැණික් ඇණවුමකට හිමිකම් කියන ලදී.

7. "CEYLON TEA – The Most Ethical Tea in the World" යන තේමාව යටතේ ලංකා තේ කලාප ප්‍රවර්ධනය.

8. ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් මිලාන් සංචාරක ආයතන වෙත සංවිධානය කරන ලද විකුණුම් බලගැන්වීම, නව සේවාවන් සහ නව මිලගණන් ප්‍රවර්ධන වැඩසටහන්.

9. තේ රස බැලීමේ අවස්ථා, දිනුම් ඇදීම්, ශ්‍රී ලාංකික පාරම්පරික නැටුම් සහ සංස්කෘතික සංදර්ශන වැනි බොහෝ දෛනික ක්‍රියාකාරකම් සහිත සම්පූර්ණ සතියක් CEYLON TEA සඳහා වෙන්කිරීම.

10. ස්විස්-ආසියානු වාණිජ මණ්ඩලීය වාර්ෂික මාණ්ඩලික රැස්වීම ශ්‍රී ලංකා වේදිකාවෙහි පැවැත්වූ අතර දෙරට අතර යහපත් සබඳතාවයක් එමගින් ගොඩනගා ගත හැකිවිය.

11. ලංකා තේ, කුළු බඩු, මැණික්, සංචාරක කටයුතු සහ අත්කම් ආදී ශ්‍රී ලංකාවේ සෑම ආකාරයකම නිෂ්පාදන පිළිබඳ ව්‍යාපාරික විමසුම් 120 ක් පමණ ලැබීම.

12. සහභාගී වූ සෑම රටකම ජාතික දිනය නැමැති අංගයක් සංවිධානය වූ අතර ශ්‍රී ලංකාවේ ජාතික දින වැඩසටහන ඉතාලියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහය ඇතිව 2015 ඔක්තෝබර් සහ 22 වන දින සාර්ථකව පැවැත්වීම.

13. මිලානෝ ඉතාලියානු මණ්ඩලය සහ ඉතාලියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහය ද ඇතිව ශ්‍රී ලංකාවේ ජාතික දින වැඩසටහනට සමගාමීව ව්‍යාපාරික සම්මන්ත්‍රණයක් සහ මාධ්‍ය හමුවක් පැවැත්විය. මෙහි ප්‍රධාන අසුන හොබවන ලද්දේ සංචාරක සහ ක්‍රිස්තියානි කටයුතු ගරු අමාත්‍යතුමා වන අතර ප්‍රමුඛ පෙළේ ඉතාලි ව්‍යාපාරිකයින් 200 ක් පමණ ඒ සඳහා සහභාගී විය.

## 6.8 නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ ලබාදීම

ශ්‍රී ලංකාව වෙත පැමිණීම සහ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ක්‍රියාකාරකම් වල යෙදීමට, විදේශීය සමාගම්වල සහ වෙනත් වෙළඳ සහ වාණිජ ව්‍යාපාරවල සම්බන්ධීකරණ කාර්යාලවල/ ශාඛා කාර්යාලවල සේවයේ නියුතු විගමණිකයන් සඳහා නේවාසික වීසා බලපත්‍ර නිකුත්කිරීම සඳහා නිර්දේශ ලිපි නිකුත්කිරීමේ බලය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වාණිජ දෙපාර්තමේන්තුව වෙත පවරාදී ඇත. එවැනි සේවා නියුක්තියක් මගින් අපනයන වෙළඳාම, තාක්ෂණික මාරුව සහ ඵලදායිතා වර්ධනය සඳහා ඇතිවන ඍජු ප්‍රතිලාභ සහ එමඟින් ජාතික ආර්ථිකයට ඇතිවිය හැකි වාසි සැළකිල්ලට ගනිමින්, එලෙස වීසා බලපත්‍ර නිර්දේශ සඳහා ඉදිරිපත්වන අයදුම්පත් දැඩි ලෙස තක්සේරු කරනු ලැබේ.

වර්ෂය තුළදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් බ්‍රිතාන්‍ය ජාතිකයින් 42ක්, ඉන්දියානු ජාතිකයින් 40ක්, ජපන් ජාතිකයින් 14ක්, කොරියානු ජාතිකයින් 13ක්, පාකිස්ථාන ජාතිකයින් 13ක් යනාදී වශයෙන් විවිධ ජාතීන්ගෙන් සහ චීන, මැලේසියානු, තායි යනාදී අනෙකුත් ජාතීන්ගෙන් අයදුම්කරුවන් 86 දෙනෙකුගෙන් සහ යැපෙන්නන් 69 දෙනෙකුගෙන් සමන්විත විගමණිකයන් 155 දෙනෙකු සඳහා නේවාසික වීසා බලපත්‍ර නිර්දේශ නිකුත් කරනු ලැබ ඇත.

## 6.9 ණයදෙන ආයතන අනුමත කිරීම

ඕනෑම සමාගමක්, ආයතනයක් හෝ පුද්ගලයකු අනුමත කරන ලද ණය දෙන ආයතනයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට 1949 අංක 06 දරන උකස් පනත යටතේ වාණිජ අධ්‍යක්ෂ ජනරාල් වෙත බලය පවරා ඇත. අධ්‍යක්ෂ ජනරාල්වරයා එසේ සිය අනුමැතිය දෙනු ලබන්නේ, 1949 අංක 06 දරන උකස් පනතේ 114 (1) වන වගන්තිය යටතේ ගරු අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයකුගෙන් හා තවත් පුද්ගලයින් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක නිර්දේශ මත පදනම්ව වේ.

වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් එවැනි අයැදුම්පත් 11 ක් (නව 08 සහ පරණ 03) සැලකිල්ලට ගත් අතර එයින් සමාගම් 3ක් මණ්ඩලයේ අනුමැතිය ඇතිව අනුමත ණයදෙන ආයතන ලෙස ගැසට් නිවේදනය කරන ලදී.

## 6.10 දැනුවත්කිරීමේ වැඩසටහන් පැවැත්වීම

### 6.10.1 "රජයේ සහ ඉන් ඔබ්බට දින 100 යටතේ වෙළඳ ප්‍රතිපත්ති සහ අපනයන ප්‍රවර්ධනය" පිළිබඳ සම්මන්ත්‍රණය

ශ්‍රී ලංකා රජයේ දින 100 වැඩසටහනට අනුව වාණිජ දෙපාර්තමේන්තුව සහ අපනයන සංවර්ධන මණ්ඩලය ඒකාබද්ධව "රජයේ සහ ඉන් ඔබ්බට දින 100 වැඩසටහන යටතේ වෙළඳ ප්‍රතිපත්ති සහ අපනයන ප්‍රවර්ධනය සහ ඉන් ඔබ්බට" යන තේමාව යටතේ සම්මන්ත්‍රණයක් සංවිධානය කොට 2015 පෙබරවාරි මස 25 වන දින ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ශ්‍රවණාගාරයේදී ප්‍රතිපත්ති සැලසුම් ආර්ථික කටයුතු, ළමා හා යොවුන් කටයුතු සහ සංස්කෘතික කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍ය හර්ෂ ද සිල්වා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ප්‍රධාන දේශක ලෙසින් කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මැතිතුමාගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

මෙම වැඩසටහනෙහි ප්‍රධාන පරමාර්ථය වූයේ රජයේ දින 100 වැඩපිළිවෙල යටතේ ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්ති සහ අපනයන ප්‍රවර්ධන කටයුතුවලට අනුව වාණිජ දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්යභාරය පිළිබඳ ව්‍යාපාරික ප්‍රජාව සහ අපනයන සමාගම් දැනුවත් කිරීමයි.

රජයේ ගෝලීය වෙළඳ සැලැස්මෙහි ප්‍රකාශය පිළිබඳ දැනුවත් වීම සඳහා 250 කට අධික විවිධ මට්ටමේ අපනයනකරුවන් රැසක් මෙම සම්මන්ත්‍රණය සඳහා සහභාගී විය. සම්මන්ත්‍රණය අතරවාරයේදී ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳ පාලන තන්ත්‍ර, අපනයන ප්‍රතිපත්ති, ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වැනි වාණිජ දෙපාර්තමේන්තුව සහ අපනයන සංවර්ධන මණ්ඩලය අයත් විෂය පිළිබඳ වැදගත් දැනුම් සම්භාරයක් ලබාදෙන ලදී. එමෙන්ම දින 100 වැඩසටහනෙහි අරමුණු ලඟාකර ගැනීම යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය ආරම්භ කර ඇති වැඩසටහන් පිළිබඳවත් මෙහිදී විස්තර කරන ලදී.

### 6.10.2 ශ්‍රී ලංකාවේ ස්විස් ව්‍යාපාර සමඟ වට මේස සාකච්ඡා

ශ්‍රී ලංකාවේ ස්විස් ව්‍යාපාර පිළිබඳ වට මේස සාකච්ඡා ශ්‍රී ලංකා රජයෙහි සහ ස්විස් ව්‍යාපාරික ප්‍රජාව පාර්ශවකරුවන් අතර 2015 මැයි මස 15 වන දින ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ශ්‍රවණාගාරයෙහිදී පැවැත්විය. මෙම කටයුත්ත වාණිජ දෙපාර්තමේන්තුව, ස්විස් තානාපති කාර්යාලය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ එකතුවෙන් සංවිධානය කරන ලදී.

මෙම සාකච්ඡාවන්හි පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාව වෙත ස්විස් ආයෝජන ඉහළ දැමීම සහ ඔවුන්ගේ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් ඔවුන් දරන අදහස් හුවමාරු කර ගැනීමටයි. මෙම සාකච්ඡා වටය කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මැතිතුමාගේ සහ ප්‍රතිපත්ති සැලසුම් ආර්ථික කටයුතු, ළමා හා යොවුන් කටයුතු සහ සංස්කෘතික කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍ය හර්ෂ ද සිල්වා මැතිතුමාගේ සහභාගිත්වයෙන් පැවැත්වූ අතර එය තවත් සම්භාවනීය කිරීමට ශ්‍රී ලංකාවෙහි හා මාලදිවයිනෙහි ස්විස්ටර්ලන්ත රජයේ තානාපති Heinz Walker-Nederkoon මහතාගේ සහභාගිත්වය ද මෙහිදී කැපී පෙනුණි. කොළඹ පිහිටි ස්විස් ව්‍යාපාර 20 කට වැඩි ප්‍රමාණයක නියෝජිතයින් මේ සඳහා සහභාගී වූ අතර ඔවුන් විසින් ශ්‍රී ලංකාවේ තම ව්‍යාපාර කටයුතු පිළිබඳව ඔවුන් සිදුකරගෙන යනු ලබන සමාජ සත්කාර වැඩසටහන් පිළිබඳවත්, ශ්‍රී ලංකාවෙහි ව්‍යාපාර කරන විට මුහුණ දෙන අභියෝග සහ ආයෝජනය සඳහා ඔවුන්ගේ ඉදිරි සැලසුම් පිළිබඳවත් අදහස් හුවමාරු කරන ලදී.

මෙම වට මේස සාකච්ඡා වලට අමතරව 2015 මැයි මස තෙවන සතියෙහි ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගෙන් හා ව්‍යාපාරික නියෝජිත්වයෙන් සැදුම්ලත් ස්විස් නියෝජිත කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරයක්

සඳහා පැමිණෙන ලදී. මෙම සංචාරයෙහි අරමුණු වූයේ ස්විස් ගැනුම්කරුවන් සඳහා ඇති අවස්ථා සොයා බැලීමයි. එම දූත පිරිසෙහි නායකත්වය දරන ලද්දේ ආර්ථික කටයුතු පිළිබඳ රාජ්‍ය මහලේකම් කාර්යාලයේ ද්විපාර්ශවිය ආර්ථික සබඳතා අංශයෙහි ප්‍රධානී ආචාර්ය Livia Leu විසිනි. ස්විස්-ආසියානු වාණිජ මණ්ඩලයෙහි සභාපති, ගරු තානාපතිතුමා සහ තානාපති කාර්යාල නිළධාරීන් දෙදෙනෙක් මෙම දූත පිරිස නියෝජනය කරන ලදී.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය, අපනයන සංවර්ධන මණ්ඩලය සහ ලංකා වාණිජ මණ්ඩලය යන ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ගරු අමාත්‍යවරුන් සමඟ නියෝජිත රැස්වීම් සංවිධානය කිරීමෙන් නියෝජන කටයුතු පහසු කිරීමට වාණිජ දෙපාර්මේන්තුවට හැකිවිය. මෙම රැස්වීම අතරතුරේදී ශ්‍රී ලංකාවට පිරිනමන ලද Swiss GSP සහනය භාවිතය, ආර්ථික ප්‍රතිසංස්කරණ, ආයෝජකයින්ට පවතින අවස්ථා, ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම සහ ද්විපාර්ශවීය ආයෝජන ගිවිසුම් මෙන්ම විදේශීය ආයෝජකයින පහසු කරනු වස් "One stop shop" ඇති කිරීමේ වැදගත්කම පිළිබඳව ද සාකච්ඡා සිදු කරන ලදී.

### 6.10.3 "පකිස්ථානයේ ව්‍යාපාර අවස්ථා" ශ්‍රී ලංකා - පකිස්ථාන අන්තර් ව්‍යාපාර සැසිය

"පකිස්ථානයේ ව්‍යාපාර අවස්ථා" නමින් ශ්‍රී ලංකා - පකිස්ථාන අන්තර් ව්‍යාපාර සැසිය නොවැම්බර් 11 වන දින ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ප්‍රජාවගේ සහභාගිත්වයෙන් හා දෙරටේ වාණිජ කටයුතු අමාත්‍යවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය.

පකිස්ථානයේ ඖෂධ, ආහාර සහ සිමෙන්ති ආදී ක්ෂේත්‍රයන්වල පෞද්ගලික අංශයේ නියෝජිතයින් 8 ක් එරට අමාත්‍යතුමා සමඟ එක් විය. ශ්‍රී ලංකාවේ වෙළඳ සහ ආයෝජනය ප්‍රවර්ධන ආයතනයන්හි නිළධාරීන් සහ පෞද්ගලික අංශයේ නියෝජිතයින් 150 ක් පමණ එයට සහභාගී විය.

දෙරටෙහිම පෞද්ගලික අංශයන්හි නියෝජිතයින් අදාල දේශ සීමා බාධක සම්බන්ධයෙන් තමන්ගේ ගැටලු ඉක්මනින් විසඳා ගැනීම පිණිස අදාල අමාත්‍යවරුන් වෙත ඉදිරිපත් කරන ලදී

## 6.11 හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන්

### 6.11.1 වෙළඳ ප්‍රතිපත්ති විශ්ලේෂණයෙහි හැකියාව වර්ධනය කිරීම

වෙළඳ ප්‍රතිපත්ති විශ්ලේෂණය ට අදාලව නව විශ්ලේෂණාත්මක මෙවලම් භාවිතය පිළිබඳ නිළධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව වාණිජ දෙපාර්තමේන්තුව, UNESCAP හා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව වෙළඳ ප්‍රතිපත්ති විශ්ලේෂණයෙහි හැකියා වර්ධනය කිරීම යනුවෙන් තෝරාගත් පුහුණු වැඩසටහනක් 2015 ජූලි මස 13 සිට 15 යන දිනයන්හි කොළඹ දී පවත්වන ලදී. මෙහිදී වෙළඳ ප්‍රතිපත්ති විශ්ලේෂණයෙ දී වැදගත් වන නවතම මෙවලම් පිළිබඳව සත්‍ය වෙළඳ/ආර්ථික දත්ත මත පදනම් ව අභ්‍යාස සිදු කරමින් සහභාගී වූවන් හට මනා අවබෝධයක් ලබා දෙන ලදී.

වාණිජ දෙපාර්තමේන්තුව, අපනයන සංවර්ධන මණ්ඩලය සහ වෙළඳ මණ්ඩල නියෝජනය කරමින් නිළධාරීන් 35 ක් වැඩසටහන සඳහා සහභාගී විය.

## 7. ප්‍රභවස්ථාන සහතික නිකුත්කිරීම

පහත සඳහන් වරණීය ගිවිසුම් සහ කලාපීය, ද්විපාර්ශ්වික සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය කරනු ලබන ශ්‍රී ලාංකික සම්භවීය නිෂ්පාදන සඳහා වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත්කරනු ලබයි.

- වරණීය පොදු ක්‍රමය (GSP)
- ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)
- සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)
- දකුණු-ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- ආසියානු-පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)

සාමාන්‍ය වැඩකරන දිනයකදී, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික 500 ක් සම්බන්ධයෙන් කටයුතු කර නිකුත් කරනු ලැබ ඇත. පූර්ව දැනුම්දීමකින් තොරව රාජකාරී වේලාව තුළ ඕනෑම අවස්ථාවක හමුවිය හැකි පූර්ණකාලීනව ප්‍රභවස්ථාන සහතික අංශය වෙත අනුයුක්තව කටයුතුකරන, ඉතා ඉහළ මට්ටමින් අභිප්‍රේරණය කරන ලද නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් උපදෙස් ලබා දීම සඳහාත්, වැඩිදුර තොරතුරු පැහැදිලිකර දීම සඳහාත් සූදානම්ව සිටියි. සාමාන්‍යයෙන්, පත්කර ඇති නිලධාරීන් විසින් අපනයනකරුවන් 30 - 50 දෙනෙකුට දිනපතා උපදෙස් ලබා දෙනු ලැබේ. ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කිරීම, විවිධ වෙළඳ ගිවිසුම් යටතේ අදාළ ප්‍රභවස්ථාන රීති නිර්ණායකය පිළිබඳව ගැඹුරු දැනුමක් තිබිය යුතු ඉතා විශේෂිත කාර්යයක් වේ. මේ සම්බන්ධයෙන් වාණිජ දෙපාර්තමේන්තුවේ වගකීම් වන්නේ;

(අ) තීරුබදු සහන සඳහා නිෂ්පාදනයක යෝග්‍යතාව තක්සේරු කිරීම,

(ආ) අපනයනකරුවන්ගේ තොරතුරු සටහන් (profiles) ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාම,

(ඇ) පිරිවැය ප්‍රකාශයන් සහ යෝග්‍යතාව සපුරාලීම සඳහා අපනයනකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් ආධාරක ලිපිලේඛන ඇගයුමට ලක්කිරීම,

(ඈ) වරණය ලබාදෙන්නා වූ රටවල ඉල්ලීම මත ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමෙන් පසු විගණන පැවැත්වීම සහ

(ඉ) ප්‍රභවස්ථාන සහතික ආශ්‍රිත දත්ත සහ විශ්ලේෂණාත්මක වාර්තා සකස් කිරීම.

පසුගිය වසර 5 තුළ වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතිකපත් වල විස්තර පහත දැක්වේ.

| ගිවිසුම | නිකුත්කරන ලද ප්‍රභවස්ථාන සහතිකපත් ගණන | | | | |
|---|---|---|---|---|---|
| | **2011** | **2012** | **2013** | **2014** | **2015** |
| EU GSP | 85,600 | 114,029 | 79,774 | 83,898 | 72,675 |
| GSP - CIS | 856 | 1,009 | 929 | 842 | 480 |
| GSP - වෙනත් | 14,782 | 13,909 | 13,410 | 12,706 | 11,985 |
| ISFTA | 35 | 9,742 | 11,088 | 10,852 | 11,494 |
| PSFTA | 30 | 8,057 | 8,190 | 7,069 | 7,320 |
| APTA | 2,424 | 2,781 | 3,482 | 4,131 | 4,025 |
| SAFTA | - | 26 | 74 | 388 | 231 |
| SAPTA | 248 | 253 | 243 | 309 | 304 |
| GSTP | 115 | 136 | 147 | 107 | 150 |
| **එකතුව** | **104,090** | **149,942** | **117,337** | **120,302** | **108,664** |

## 8. වාණිජ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සංචලන – 2015

| නිලධාරියාගේ නම | සංචලනය | දිනය |
|---|---|---|
| *උසස්වීම්* | | |
| එස්. එන්. අයි. විජේරත්න මහත්මිය | වාණිජ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් රාජකාරී භාර ගැනීම | 08.06.2015 |
| ආර්. ඩී. එස්. කුමාරරත්න මහතා | ජිනීවා හි ලෝක වෙළඳ සංවිධානයේ ස්ථිර නියෝජිත/ තානාපති ලෙස පත්වීම | 01.06.2015 |
| බී. එම්. එස්. ඒ. බී. ගොඩවිට මහතා | වාණිජ අධ්‍යක්ෂ ලෙස උසස් කිරීම | 10.06.2015 |
| ගෞතමී ආර්. සිල්වා මහත්මිය | වාණිජ අධ්‍යක්ෂ ලෙස උසස් කිරීම | 10.06.2015 |
| යූ. සමරතුංග මෙනවිය | වාණිජ අධ්‍යක්ෂ ලෙස උසස් කිරීම | 10.06.2015 |
| ඩී.ජී.ඒ.පී. ධර්මප්‍රිය මහතා | වාණිජ අධ්‍යක්ෂ ලෙස උසස් කිරීම | 10.06.2015 |
| *සේවා ස්ථාන මාරුවීම් - දෙපාර්තමේන්තුවට ආපසු පැමිණීම්* | | |
| එස්. එන්. අයි. විජේරත්න මහත්මිය<br>වාණිජ අධ්‍යක්ෂ | එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සිට දෙපාර්තමේන්තුවට පැමිණීම | 06.06.2015 |
| එම්.එම්. අබ්දුල් රහීම් මහතා<br>නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට දෙපාර්තමේන්තුවට පැමිණීම | 15.09.2015 |
| ජී.එල්. ඥානදේව මහතා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට් හි ශ්‍රී ලංකා කොන්සියුලර් කාර්යාලයේ සිට දෙපාර්තමේන්තුවට පැමිණීම | 12.02.2015 |
| එස්.එච්.එස්. ආරියරත්න මහත්මිය<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | චීනයේ බීජිං නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට දෙපාර්තමේන්තුවට පැමිණීම | 08.07.2015 |
| ඩබ්. ඒ. පී. සිරිමාන්න මහතා<br>සහකාර වාණිජ අධ්‍යක්ෂ | සෞදි අරාබියේ රියාද් නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සිට දෙපාර්තමේන්තුවට පැමිණීම | 02.01.2015 |
| *සේවා ස්ථාන මාරුවීම් - විදේශ දූත මණ්ඩල සඳහා පත්කිරීම්* | | |
| ඒ. ජී. එන්. කරුණාතිලක මහතා<br>වාණිජ අධ්‍යක්ෂ | ජිනීවා හි ලෝක වෙළඳ සංවිධානයේ ස්ථිර නියෝජිත/ තානාපති තනතුරේ සිට එක්සත් රාජධානියේ ලන්ඩන් නුවර ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය වෙත මාරු කරන ලදී | 15.06.2015 |

| | | |
|---|---|---|
| ඉසෙඩ්.ඒ.එම්. මෝහින් මහත්මිය නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට් හි ශ්‍රී ලංකා කොන්සියුලර් කාර්යාලය වෙත පත් කරන ලදී | 09.02.2015 |
| ඒ.පී.ජේ.එන්. කුමාර මහතා නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | කොරියාවේ සෝල් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත පත් කරන ලදී | 20.03.2015 |
| චරිත යට්ටෝගොඩ මහතා නියෝජ්‍ය වාණිජ අධ්‍යක්ෂ | එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත පත් කරන ලදී | 08.10.2015 |
| රුවන්ති ආරියරත්න මහත්මිය සහකාර වාණිජ අධ්‍යක්ෂ | චීනයේ බීජිං නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත පත් කරන ලදී | 06.07.2015 |
| වයි. වයි. කේ. ද සිල්වා මහතා සහකාර වාණිජ අධ්‍යක්ෂ | ඉන්දියාවේ චෙන්නායි හි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලය වෙත පත් කරන ලදී | 02.03.2015 |
| ඩී. එම්. එස්. එන්. අබේරත්න සහකාර වාණිජ අධ්‍යක්ෂ | ඊජිප්තුවේ කයිරෝ නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත පත් කරන ලදී | 18.06.2015 |
| එම්. ජී. කේ. ජේ. කුමාර මහතා සහකාර වාණිජ අධ්‍යක්ෂ | දකුණු අප්‍රිකාවේ ප්‍රිටෝරියා හි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය වෙත පත් කරන ලදී | 05.03.2015 |
| ආර්. පී. ජී. ආර්. රාජපක්ෂ මහතා සහකාර වාණිජ අධ්‍යක්ෂ | සෞදි අරාබියේ රියාද් නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත පත් කරන ලදී | 19.03.2015 |

## 9. වාර්ෂික ගිණුම් - 2015

**ශීර්ෂ අංකය: 295**

**අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :- වාණිජ දෙපාර්තමේන්තුව**

**වැඩසටහන් අංකය: 01**

**ව්‍යාපෘති අංකය: 01**

**පුනරාවර්තන වියදම්**

| විස්තරය | 2014 සත්‍ය වියදම Rs. 000 | 2015 අනුමත ඇස්තමේන්තුව Rs. 000 | 2015 සංශෝධිත ඇස්තමේන්තුව Rs. 000 | 2015 සත්‍ය වියදම Rs. 000 | 2015 ඉතිරිය Rs. 000 |
|---|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 34,179 | 44,600 | 45,456 | 44,898 | 558 |
| වෙනත් | 57,610 | 61,705 | 60,197 | 51,104 | 9,093 |
| මුළු වියදම් පුනරාවර්තන | **91,789** | **106,305** | **105,653** | **96,002** | **9,651** |

## මූලධන වියදම්

| වැය විෂය අංකය / විස්තර | 2014<br>සත්‍ය වියදම<br>Rs. 000 | 2015<br>අනුමත ඇස්තමේන්තු<br>Rs. 000 | 2015<br>සංශෝධිත ඇස්තමේන්තු<br>Rs. 000 | 2015<br>සත්‍ය වියදම<br>Rs. 000 | 2015<br>ඉතිරිය<br>Rs. 000 |
|---|---|---|---|---|---|
| **මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම** | **140** | **500** | **3,098** | **3,097** | **1** |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් (2001) | 0 | 100 | 2,552 | 2,552 | 0 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ (2002) | 43 | 0 | 0 | 0 | 0 |
| වාහන (2003) | 97 | 400 | 546 | 545 | 1 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **4,905** | **6,450** | **4,504** | **2,618** | **1,886** |
| ලී බඩු හා කාර්යාලයීය උපකරණ (2102) | 4,707 | 5,000 | 3,200 | 2,548 | 652 |
| යන්ත්‍රෝපකරණ (2103) | 198 | 1,450 | 1,304 | 70 | 1,234 |
| **මානව සම්පත් සංවර්ධනය** | **3,166** | **2,650** | **2,650** | **2,135** | **515** |
| කාර්ය මණ්ඩල පුහුණු (2401) | 3,166 | 2,650 | 2,650 | 2,135 | 515 |
| **වෙනත් මූලධන වියදම්** | **5,020** | **6,000** | **6,000** | **4,292** | **1,708** |
| ආයෝජන (2502)<br>01. අපනයන වෙළඳපල ගවේෂණය කිරීම | 5,020 | 6,000 | 6,000 | 4,292 | 1,708 |
| **එකතුව** | **13,231** | **15,600** | **16,252** | **12,142** | **4,110** |